# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2015 ජනවාරි 20 වන අඟහරුවාදා**
2015 தை 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th January 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.48 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.48 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.48 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරළගේ මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. பிரதித் தவிசாளர் [யசபால கோரலகே அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Deputy Chairman [ Yasapala Koralage ] in the Chair*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුභ උදෑසනක් ඔබ සැමට. ලැබුවා වූ 2015 නව වසර සුභ නවසරක් වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

# නිවේදන
## ANNOUNCEMENTS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*i*

*"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට හා ඊට අදාළ 2014 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"2014.11.04 දින සභා සම්මත වූ ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසවලින් විපතට පත් වූවන්ට සහන සැලසීමට වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් ඉල්ලා සිටිනු ලබන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව, සුදුසු පියවර ගැනීම සඳහා බස්නාහිර පළාතේ විදුලිබල, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා."*

*iii*

*"සභාවේ ආසන පැනවීම සම්බන්ධව කිනම් හෝ ගරු මන්ත්‍රීවරයෙකුට ගැටළුවක් හෝ ඉල්ලීමක් ඇත්නම් ලිඛිතව ගරු සභාපතිතුමා වෙත හෝ සභා ලේකම්තුමා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දැනුම් දෙනවා.*

*සභා රීතීන් හා සභා සම්ප්‍රදායන් අනුව ලබාදිය හැකි සහනයන් ලබා දීමට බලාපොරොත්තු වන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

# ලිපි ලේඛන පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර සභාගත කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බස්නාහිර පළාත් සභාවේ,

i. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව හා,

ii. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක විගණකාධිපති වාර්තාව යන

විගණකාධිපති වාර්තාවන් මම මෙම සභාවට පිළිගන්වනවා.

***එකී විගණකාධිපති වාර්තාවන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***

*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Reports to the Provincial Public Accounts Committee.*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

2015.01.05 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේස මත තබා ඇති බව ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*Hon. Deputy Chairman declared that copies of the relevant report are have been placed on the tables of the Hon. Members.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

## මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය : බඳවා ගැනීම්
ROAD PASSENGER TRANSPORT AUTHORITY : RECRUITMENTS

**01.**

**කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ හා සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/14/59)**

අ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ තනතුරු පුරප්පාඩු සම්බන්ධයෙන් පරිපාලන චක්‍රලේඛ අංක 03 මගින් මෙම වර්ෂයට අදාළව තනතුරු වර්ග 06 ක් සඳහා අයදුම්පත් කැඳවීමක් කළේද?

ආ. එකී එක් එක් තනතුරු සඳහා අයදුම් කළ අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ නම් ඉදිරිපත් කර අදාළ සම්මුඛ පරීක්ෂණයේදී එම අය වෙන් වෙන්ව ලබාගත් ලකුණු ප්‍රමාණය මෙම සභාවට ඉදිරිපත් කළ හැක්කේද?

ඇ. නොඑසේ නම් ඒ මන්ද?

ඈ. අදාළ සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියේදී බරපතළ අකටයුතු අසාධාරණකම් සහ වංචාවන් සිදු වී ඇති බව ඔබතුමා දන්නේද?

ඉ. එසේ දන්නේ නම් ඒ මොනවාද? කා හටද?

ඊ. විෂය භාර අමාත්‍යවරයා ලෙස මෙම බරපතළ විෂමාචාරයන් නිවැරදි කිරීමට ගෙන ඇති පියවර හා ක්‍රියා මාර්ග කවරේද?

**ගරු නිමල් ලාන්සා**(ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

අ. නැත.

ආ. අදාළ නොවේ.

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

ඊ. අදාළ නොවේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. මෙම ප්‍රශ්නයේ 'අ' ප්‍රශ්නයට දෙන ලද පිළිතුර මත පදනම්ව තමයි ඔබතුමා අනෙක් ප්‍රශ්නවලට අදාළ නොවේ කියන කාරණාව කියන්නේ. මේ අනුව පුරප්පාඩු පිරවීමක් සම්බන්ධයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කටයුත්තක් මේ චක්‍රලේඛයට අදාළව සිද්ධ වුණේ නැද්ද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අපේ සාමාන්‍යාධිකාරීතුමා එවලා තිබෙන වාර්තා අනුව එහෙම එකක් වෙලා නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දෙවැනි ප්‍රශ්නය. ගරු ඇමැතිතුමා, මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමා පසුගිය අවස්ථාවේ කල් ඉල්ලූ විට උත්තරයට පැහැදිලිව සඳහන් කර සිටියා මේ කාරණය සම්බන්ධයෙන් යමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ප්‍රමාණවත් කාලයක් දෙන්නය කියලා. එතකොට දැන් එදා වෙලා තිබෙනවා කියන අකටයුත්ත, අද දිනය වනකොට වෙලා නැහැයි කියන තැනට ඔබතුමාට කරුණු කියන්න පුළුවන්කම ලැබුණේ කොහොමද?

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මන්ත්‍රීතුමා එදා මම කල් ගත්තා මිසක් ඒ ගැන අදහස් ප්‍රකාශ කළේ නැහැ. මට එවලා තිබෙන පිළිතුර තමයි මම සභාගත කරන්නේ. ඔබතුමා හිතනවා නම් මේක නැවත වතාවක් බලන්න කියලා අපි ආපහු ලේකම්තුමා හරහා නැවත වාර්තාවක් කැඳවමු.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

තුන්වැනි අතුරු ප්‍රශ්නය. විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් කරන ලද විගණන වාර්තාවේ සඳහන් බරපතළ දූෂණ සහ අක්‍රමිකතා, මේ පත් කිරීම් සම්බන්ධයෙන් වෙලා තිබෙනවා. නැවත ඔබතුමා මේ සම්බන්ධයෙන් විමසලා සාධාරණ උත්තරයක් ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ගරු ඇමැතිතුමා කිව්වේ ඒක තමයි.

***න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon. K.D. Aruna Deepal, member, under item No. 2 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it, it was ordered that the question be referred to the next Council sitting.*

***න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති දෙකක කාලයක් කල් ඉල්ලූ බැවින් ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question in the name of Hon. Lakshman Nipuna Arachchi, member, under item No. 3 of the agenda, was presented to the Hon. Chief Minister and as two weeks time was asked for it, it was ordered that the question be referred to the next Council sitting.*

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ප්‍රසන්න රණතුංග**(ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranatunga(Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Governmentand Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන ගරු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පිළිබඳව බස්නාහිර පළාතේ පළාත් සභාවේ අපේ සුභ පැතුම් මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම අගමැති ධූරයට පත් වුණු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, අලුතෙන් පත් වූ අමාත්‍යවරුන්ටත් අපේ සුභ පැතුම් මේ අවස්ථාවේදී පුද කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ මැතිවරණ කාල සීමාවේදීම අපි කථා වුණේ, යහපාලනය පිළිබඳව. මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ මේ රටේ යහපාලනයක් ඇති කරලා, වෙනසක් ඇති කරයි කියන බලාපොරොත්තුව ඇතිව. අපි දන්නවා, පසුගිය මැතිවරණයෙන් පස්සේ මේ රටේ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වෙන්න පටන් අරගෙන තිබෙනවා. මම හිතන්නේ නැහැ, මෙතැන ඉන්න කිසිම පක්ෂයක කෙනෙක් ඒක අනුමත කරයි කියලා. මේ අවස්ථාවේදී මම මේ ලිපි ලේඛන සභාගත කරනවා. නිවාස ගිනි තැබීම්. මීරිගම චන්ද්‍රා මහීපාල මහත්මියගේ. ත්‍රීරෝද රථයක් ගිනි තියලා, ලොරියක් ගිනි තියලා, නිවස ගිනි තියලා අලාභ හානි කරලා පොලීසියේ පැමිණිලි කරලා තිබෙනවා. ඡායාරූප එක්ක, ඒ සිද්ධිය පුවත්පත්වලත් දාලා තිබුණා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගම්පහ දිස්ත්‍රික්කයේ මට ආරංචි වන හැම තැනකටම මා පෞද්ගලිකව ගියා. ඒ වාගේම ඊට දින කිහිපයකට පස්සේ දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ නිවසට ගිනි තියලා තිබුණා. ඒ වාගේම

වත්තල ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනත් ජයසිරි මහතාගේ නිවසට පහර දීමක් සිදු කර තිබුණා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දිවුලපිටියේ වලව්වත්ත නිවසකට පැනලා පුද්ගලයෝ දෙදෙනෙකුට කඩු ප්‍රහාර එල්ල කරලා ඉතාමත්ම ප්‍රචණ්ඩව - මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ මේ කරුණු කාරණා පිළිබඳව -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙන්න ඕනෑ මෙපමණකින් හරි නතර වුණු එක ගැන.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම එතැනට එන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අවුරුදු 20 කට පස්සේ ආණ්ඩුවක් මාරු වෙලා මේක බේරා ගත්තු එක ගැන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා මේ කාරණා අනුමත කරනවා ඇති. ඔබතුමන්ලා මේ ක්‍රියා පටිපාටිය අනුමත කරනවා නම්, රටේ ජනතාවට කියන්න ඒක තමයි යහපාලනය කියලා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

යහපාලනය ගැන අපි කථා කරන්නම්. ඔබතුමා මේකට කථා කරන්න -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය දීපු -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කෙනෙක් නොවෙයි මම. එතුමාට විරුද්ධව කටයුතු කරපු කෙනෙක් මම. ඒක මම පිළිගන්නවා. නමුත් ඔබතුමන්ලා දැනගන්න ඕනෑ 1977 ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ආවාට පස්සේ මේ වාගේම ක්‍රමවේදයක් අනුගමනය කළා. 2001 රනිල් වික්‍රමසිංහ අගමැති වුණාම මේ වාගේම තත්ත්වයක් උදා වුණා. එතැන ඉඳලා ගිනි තියලා හැබැයි, ඔබතුමන්ලා මැතිවරණයට ඉස්සෙල්ලා කිව්වේ, මේ දේවල් වෙන්න ඉඩ තියන්නේ නැහැයි කියලා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අද මහින්ද රාජපක්ෂ මහත්තයා දින්නා නම් 75,000 ක් හිරේ දානවා. චීන සමූහ ආණ්ඩුව හැදුවා වාගේ 75,000 ක් හිරේ දානවා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අද මහින්ද රාජපක්ෂ මහත්තයා දින්නා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඊයේ අගලවත්තේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

හිරේ දාන්න හිටියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පස්සේ කථා කරන්න අවස්ථාව දෙන්නම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඊයේ අගලවත්තේ දැක්කේ නැද්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමන්ලා මේකට තරහා ගන්න ඕනෑ නැහැ. මම දන්නවා. මම ජනාධිපතිතුමාට, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට කථා කරපුවාම එතුමන්ලා ඒ පිළිබඳව කඩිනමින් කටයුතු කළා. ඒකත් මම කියනවා. අපි පැහැදිලිවම ඔබතුමන්ලාගේ දින 100 වැඩ පිළිවෙළට සහයෝගය ලබා දෙනවා කියන ප්‍රකාශය කළා. සභාවක් හැටියට අපි ඒකට සහයෝගය දෙනවා. ඒක නොවෙයි, මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ. ඔබතුමන්ලා මේක තේරුම් ගන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ අගලවත්ත ප්‍රදේශයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

මන්ත්‍රීවරයෙක්ව දණ ගස්සලා කරපු දේ රූපවාහිනියේ පෙන්නුවා. ද්‍රවිඩ මන්ත්‍රීවරයෙක්. මේක බෙරුවල වුණා නම්, මුස්ලිම් කෙනෙකුට වුණා නම් අද මොකක්ද බෙරුවල වන තත්ත්වය කියන්න. (බාධා කිරීම්) පොඩ්ඩක් ඉන්න කෝ? මම මේ කාරණා කියන්නේ, අපේ ආණ්ඩුව තියෙද්දිත් මේ වාගේ සිද්ධීන් වුණා. ඒ නිසා තමයි අපට ජනතාව ඒ තීන්දුව ලබා දුන්නේ. ඒ නිසා ඔබතුමන්ලාගේ දින 100 තුළ මේ තත්ත්වය එනවා නම්, මේක දීර්ඝ කාලීනව ගියොත් මොන තත්ත්වයට පත් වෙනවාද කියන එක තමුන්නාන්සේලා කල්පනා කරන්න. ඔබතුමන්ලා පාලනය කරන්න ඕනෑ නම් මේවා නිවැරදි කර ගන්නයි. ද්‍රවිඩ මන්ත්‍රීවරයෙක් දණ ගස්සලා කරපු දේ - අපි මේ බොරු කියනවා නොවෙයි. මේවා ඡායාරූපත් එක්ක මම සභාගත කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ අයට නිසි සාධාරණයක් ලබා දිය යුතු නිසා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට විරුද්ධව කටයුතු කරපු පිරිසක්. අපි එතුමාට ඡන්දයක් දුන්නේ නැහැ. අපි අපේ අපේක්ෂකයා වෙනුවෙන් පෙනී හිටපු කණ්ඩායමක්. නමුත් අපි හැම තිස්සේම කිව්වා, රටේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන්න ඕනෑ කියලා. TNA පක්ෂය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජයග්‍රහණයට ලොකු දායකත්වයක් දුන්නා. මැතිවරණ ප්‍රතිඵල දිහා බැලුවාම උතුරු - නැගෙනහිර ඇරෙන්න අනෙක් පළාත්වල ප්‍රතිඵලය 50.93% ක් මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලැබෙන කොට උතුරු - නැගෙනහිර දිස්ත්‍රික්කවල 23% යි ගණනක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමාට ලැබුණේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

බස්නාහිර අපි දින්නා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම නැහැයි කියන්නේ නැහැ. මම මේ සමස්තය කියන්නේ - එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ඉල්ලීමක් කළා, මේ රටේ අපි ලබාගත්තු නිදහස, අපේ ඒකීයභාවය පිළිබඳව රජයේ අවධානය යොමු කරන්නය කියලා. ඒ නිසා පක්ෂයක් හැටියට එතුමන්ලාට ඒ වගකීම ඉටු කරන්න තිබෙනවා. මොකද, එතුමන්ලා මේ ජයග්‍රහණයේ කොටස්කරුවෙක් හැටියට. නමුත් මම කනගාටු වෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම මේ ඡායාරූපත් එක්ක මේ CD එක සභාගත කරනවා. ලක්බිම පුවත්පතේ 2015 ජනවාරි 19 වැනිදා උතුරු - නැගෙනහිරි ආරක්ෂාව පිළිබඳව වවුනියාවේ සනත් ප්‍රියන්ත මාධ්‍යවේදියා ලියන ලිපියේ කොටසක් මම සභාගත කරනවා.[1]

*"පාප් වහන්සේ මඩුමඩු දේවස්ථානය කරා පැමිණියේ ගුවන් මගිනි. 14 වනදා පස්වරු 3.00 සිට ප.ව. 4.45 දක්වා උන්වහන්සේ මඩු ප්‍රදේශයේ රැඳී සිටියහ. මෙම අවස්ථාවට සහභාගී වීම සඳහා ලක්ෂ දෙකක පමණ ජනතාවක් මඩු වෙත පැමිණ සිටියහ. මේ අතර පාප් වහන්සේගේ සංචාරය සිදුවන විට උතුරේ සාමය අගයන ජනතාව තිගැස්මට ලක් කෙරෙන සිදුවීමක්ද වාර්තා විය. පාප් වහන්සේ ලංකාවට සැපැත් වූ 13 වනදා වව්නියා නගර සභා ක්‍රීඩාංගනයට පිරිසක් රැස්වූහ. ඔවුන් අතර පුවරු රැසක් වූහ. එහි Pope Visit Sri Lanka වෙනුවට Pope Vsit Eelam ලෙසද ඇතැම් පුවරු වල ඊළාම් බිමේ පහස ලබන පාප් වහන්සේ සාදරයෙන් පිළිගනිමු යන්නද සඳහන් විය. මේ පුවරු සියල්ල දෙමළෙන් ලියවී තිබිණි."*

---

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

මම මේ පුවත්පත් වාර්තාව ඉදිරිපත් කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම මේ CD එකේ තිබෙන දේවල්, අපි ඡායාරූප අරගෙන දෙමළෙන් ඒක සටහන් කරලා තිබුණා. මේ කාරණා ඉදිරිපත් කරන්නේ වෙන මොකවත් නිසා නොවෙයි. දින 100 වැඩ සටහනට අපිත් සම්බන්ධ වෙනවා කියලා ප්‍රකාශ කළා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා. ඒ නිසා මේ තත්ත්වය දිගින් දිගටම නොයන්න කටයුතු කිරීමේ වගකීම - අද අපි පාර්ලිමේන්තුවේ ඉන්නේ විරුද්ධ පක්ෂයේ. අද අපි ඉන්නේ විරුද්ධ පක්ෂයේ. මම දන්නවා ඔබතුමන්ලා ලොකු උත්සාහයක යෙදෙනවා මේ පළාත් සභාවේ බලය ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ. මොකද, ප්‍රජාතන්ත්‍රවාදී විධියට මේ රටේ ජනතාව මේ පළාත් සභාවේ බලය දුන්නේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයට. මම කියනවා ඌවේ වුණා නම්, තවත් ප්‍රදේශවල වෙනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ. මේ මන්ත්‍රීවරු කැමැති නම් ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. අපි තනතුරු බලාගෙන මේවාවල රැඳෙන අය නොවෙයි. නමුත් අපි අද නියෝජනය කරන්නේ විරුද්ධ පක්ෂයක් හැටියට. (බාධා කිරීමක්) මම හම්බ වුණා. එතුමා දැන් මගේ සභාපති.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කිව්වා නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වුණොත් ඔබතුමා ආයිත් මහ ඇමැති වෙනවා කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉතින් අද මම මහ ඇමැති පුටුවේ වාඩි වෙලා නේ ඉන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කලින් ඔබතුමා කිව්වා වෙන පරිසරයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා කථාවට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම ඔබතුමාගේ සිරස වැඩ සටහන බැලුවා. ඔබතුමාගේ සිරස වැඩ සටහන මම ඊයේ බැලුවා. ඔබතුමා ඉන්න ස්ථාවරයේ මමත් ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම පෙනී ඉන්නේ ජනතාව වෙනුවෙන්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි. මම එතැන ඉන්නවා. මම ඔබතුමාත් එක්ක ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙපමණ කල් හොකරම් -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හොරකම්. ඒ කථාව නොවෙයි. ඒ නිසා නේ අපව අයින් කළේ. මම වගකීමෙන් කියනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

[සභාවේ ඝෝෂා]

දැන් ආණ්ඩුව, ඔය පැත්තෙන්. ජනාධිපතිවරයා මෛත්‍රීපාල සිරිසේන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා එතුමාට කථාව අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම මේ කියන්න යන්නේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අගමැතිවරයා. එතුමාගේ භාරයේ තමයි ආණ්ඩුව පවතින්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවසන් කරපු ඔක්කෝම ගේන්න ඕනෑ පොතට. අපි කියන්නේ ඒකයි.

**ගරු හර්ෂණ රාජකරුණා- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමාගේ නිවේදනය කරලා, අපි න්‍යාය පත්‍රයේ ඊළඟ කාරණාවලට යමු.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතැන තිබෙන්නේ අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ. මේ අමාත්‍ය මණ්ඩලය වෙනුවෙන් මම වගකීමෙන් ප්‍රකාශ කරනවා. දැන් ඔබතුමන්ලාගේ රජයක් තිබෙන්නේ. General Audit එක දාලා මේ පළාත් සභාවේ දූෂණයක් වෙලා තිබෙනවා නම් ඒක ඉදිරිපත් කරන්න. විවෘතව අපි ආරාධනා කරනවා. අපට එහෙම හංගන්න දෙයක් නැහැ. ඒ වාගේම මධ්‍යම රජයෙන් කරපු දේවල්වලට වගකීම අපි භාර ගන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලා දින 100 වැඩ සටහනට එකතු වුණාය කියලා මේවායෙන් බේරෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. විරෝධතාවයේ ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අපි කවුරුත් -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි හොරකම් කරලා නැහැ. 2000 දී හොරකම් කරලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔය හවුල්කාරයෝ නේ? ඔබතුමන්ලාත් ගත්තා නේ? ප්‍රතිපාදන තව ගන්න හැදුවා නේ? ජනාධිපතිවරයේදී ලක්ෂ 15 ගණනේ ගන්න හැදුවා නේ? මෙතුමා ගිහිල්ලා අර අධ්‍යක්ෂතුමාගේ රෙදි ගලවන්න හැදුවා නේ? තමුන්නාන්සේලා මහජනතාවගේ සල්ලි කාලා කාලා බොරු කථා කරන්න එපා. බොරුවට කෑගහන්න එපා. තව කහින්න එපා. පරාදයි. තමුන්නාන්සේලා පරාදයි. දැන් කෝ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් කෝ ගහපු කයිවාරු. බොරු කථා කරන්න එපා, නිකම් කට තිබුණාට. කෝ? අද හුලං බැහැලා. කෝ? කයිවාරු. බයිලා ගහන්නේ නැතුව ඉන්න. බයිලා ගහන්නේ නැතුව - ලැජ්ජයි. එදා අයියෝ සිරිසේන කියලා අද -

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

කාර්යාල නවයක් ගිනි තිබ්බා. බොරුද කියලා අහන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

විපක්ෂ නායකතුමා. කථා කරන්න අවස්ථාව ලබා දෙන්න. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන වැරැද්දක් වෙලා තිබෙනවා නම් ඒ වැරැද්ද ගැන අපි කනගාටු වෙනවා. හැබැයි මතක තියා ගන්න හෝමාගම මැතිවරණ කොට්ඨාශයේ කාර්යාල නවයක් කැඩුවා. එකක් දෙපාරක් ගිනි තිබ්බා. කටවුට් දාන දාන එක කපනවා. ඒ තරම් පාහර වැඩ. අදත් දෙන්නෙක් රෝහලේ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙතැනදී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. ගරු ප්‍රධාන ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැතිවරණයකින් පස්සේ සාමාන්‍ය මට්ටමෙන් ප්‍රචණ්ඩ ක්‍රියා සිදු වෙනවා කියන එක මම පිළිගන්නවා. හැබැයි, මේ මට්ටමෙන් වෙනකොට අපට ඒක අනුමත කරන්න බැහැ. හැබැයි, මම කියනවා, මීනුවන්ගොඩ ආසනයේ ඔය -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු හර්ෂණ රාජකරුණා- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

මෙතුමන්ලා මේ කථා කරන්නේ මේක ඉවර වුණාට පස්සේ. මේ මැතිවරණ කාල සීමාවේ, ඒ මාස 1 ½ කරපු දේවල් අපි කථා කරන්න ගියොත් වෙන දෙයක් වෙනවා. දැන් තමයි මේ අයට යහපාලනය මතක් වෙලා තිබෙන්නේ. දැන්ද යහපාලනය මතක් වෙන්නේ? පසුගිය මාස 1 ½ මැතිවරණ කාලයේ කරපු දේවල් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් න්‍යාය පත්‍රය අනුව තිබෙන්නේ අමාත්‍යාංශ නිවේදන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රකාශන.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ප්‍රකාශන නොවෙයි. නිවේදන.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රකාශන සහ නිවේදන.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එතකොට මේ මහ ඇමැතිතුමා කියන්නේ පළාත් සභාවේ අමාත්‍යාංශවල ගන්න තීරණ පිළිබඳ නිවේදන නොවෙයි. එතුමා කථා කරන දේ රීතිවලට පටහැනියි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තිබෙන්නේ අමාත්‍යාංශ නිවේදන හා අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ. අමාත්‍යවරයෙක් හැටියට මම මේ ප්‍රකාශය කරන්නේ. ඔබතුමන්ලා තරහා ගන්න එපා. අපි මේක කියනවා නොවෙයි. කලබල වෙන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනෙක් කාරණාව. අද මේ වනකොට වත්තල නගර සභාව ඉස්සරහාට ගිහිල්ලා සමහර අය උද්ඝෝෂණ කරමින් ඒ පාලන අධිකාරියට කටයුතු කරන්න නොහැකි තත්ත්වයක් උදා කරලා තිබෙනවා. දැන් මේවා වුණා ඇති. දැන් මේ කාල සීමාව තුළ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අනේ .... දැන්වත් ඕක මතක් වුණු එක ලොකු දෙයක්. අවුරුදු 20 ක් තිස්සේ ඕක මතක් වුණේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මම වගකීමෙන් කියනවා. අපි අවුරුදු ගණනක් පාලනය කළා. කවදාවත් මැතිවරණයකදී මේ වාගේ තත්ත්වයක් රටේ උදා කරන්න කටයුතු කළේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි සන්තෝෂ වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අද ඒක වෙලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි සතුටු වෙනවා, දැන්වත් මතක් වුණු එක ගැන.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අද මාධ්‍ය හරහා නොයෙකුත් ප්‍රචාර ගෙන යනවා. අපි දැක්කා ඊයේ ආරක්ෂක ලේකම්තුමා පිළිබඳව ප්‍රකාශයක් කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඇත්ත නේ?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ. වැරැදියි.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හිටපු. හිටපු.

[සභාවේ ඝෝෂා]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

අර මුදල් ගනුදෙනුව, account එක ගැන එතුමා පැහැදිලි කළා. එතුමා පැහැදිලි කරලා කිව්වා මේක ආරක්ෂක ලේකම් -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

එයා දැන් ආරක්ෂක ලේකම් නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හොරුන්ව ආරක්ෂා කරන එක නොවෙයි, යහපාලනය කියන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපි දැක්කා ආරක්ෂාව. සුදු වෑන් දාලා. රටේ හැම තැනම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මර්වින් සිල්වා කිව්වේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් මර්වින් සිල්වා හොඳයිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා වාඩි වෙන්න. දෙපක්ෂයෙන්ම ඉල්ලා සිටිනවා මේ කථාව අවසන් කරන්න අවස්ථාව දෙන්න. කථා කරන්න අවශ්‍ය කෙනෙක් ඉන්නවා නම් වෙලාව දෙන්නම්. බාධා කරන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ජාතික ආණ්ඩු සංකල්පයකට යනවා නම්, ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව මේ රටේ ජාතික ආණ්ඩු සංකල්පයක් ක්‍රියාත්මක වෙනවා නම් - වැරැදි කරපු අයට නීත්‍යානුකූලව දඬුවම් දෙනවාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ඒක වෙන්න ඕනෑ, නීතිය අතට අරගෙන නොවෙයි. මිනිස්සු දණගස්සලා, ගහලා නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ඒවා අනුමත කරන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් ඊයේ වුණේ. TV එකේ පෙන්නුවේ.

**ගරු හර්ෂණ රාජකරුණා**- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

අපි කනගාටු -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක හරි. එච්චරයි. දැන් ඔබතුමන්ලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු ප්‍රධාන ඇමැතිතුමා -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා මේ දැන් ප්‍රකාශ කළා.

**ගරු හර්ෂණ රාජකරුණා**- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

මොන ප්‍රකාශද ඇමැතිතුමා. එතකොට ගස් බැඳලා තියෙන කොට, මේ කටවල් කොහේද තිබුණේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ සංවිධායකතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා**- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

මේ අවුරුදු පහේ වුණු අසාධාරණකම් කවුරුත් කථා කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංවිධායකතුමා අවස්ථාව දෙන්නම්.

**ගරු හර්ෂණ රාජකරුණා**- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

මේ සුළු සිද්ධීන් -

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව විකාරයක් කරන්න එපා. විපක්ෂයේ සංවිධායකතුමා රීති දන්නේ නැද්ද? අදහස් පළ කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපටත් කලින් කළේ ඕක තමයි. අපට කථා කරන්න දුන්නේ නැහැ. කෑ ගැහුවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. මම මේ කියන්න යන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිතුමා අද අපේ පක්ෂයේ නායකයා. අද අපේ පක්ෂයේ නායකයා ජනාධිපතිතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක ජනාධිපතිතුමාත් එක්ක අපි බලාගන්නම්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, නැහැ. එතුමා පත් කරපු අගමැතිවරයෙක් ඉන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ජනාධිපතිතුමා නැති කරන්න ඔබතුමන්ලා වැඩ කළේ. අද ලැජ්ජ නැතුව කියනවා, අපේ නායකතුමා කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැරැද්දක්. මේ අය කරන්නේ වරදක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාට කථා කරන්න ඉඩ දෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කණ්ඩායමට වාඩි වෙන්න කියන්න කෝ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉවර කරනවා. ඔබතුමන්ලා මට ඉවර කරන්න දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉල්ලීම කරන්නේ, මේ රජය භාරව කටයුතු කරන, ඒ වාගේම ඒ වගකිව යුතු අගමැතිතුමා ඇතුළු අමාත්‍යවරුන්ගෙන් මේ තත්ත්වය වළක්වලා මේ වවුනියාවේ ඇති වුණු සිද්ධිය වාගේ සිද්ධීන් ඇති නොවෙන්නත්, මේ රටේ යහපාලනය තුළ අපි ජාතික ආණ්ඩු සංකල්පයකට යනවා නම්, ඒ සංකල්පය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම නිර්මාණය වෙන්න ඕනෑ. ඒක නිර්මාණය කරන්න පුළුවන් වෙන්නේ මේ තත්ත්වයන් වළක්වා ගතහොත් පමණයි කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළා, අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශීය මන්ත්‍රීවරයෙකු දණ ගස්සලා අයුතු විධියට බලය අතට ගත්තා කියලා. මම මේ අවස්ථාවේදී ඉතාමත්ම වගකීමකින් කියනවා. මේ පළාත් සභාව යටතේ පාලනය වන අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශීය සභා තුනක් තිබෙනවා. මේ ප්‍රාදේශීය සභා තුනේ මේ මැතිවරණ ජයග්‍රහණය භුක්ති වින්දේ නීතිය, බලය අතට අරගෙන.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්න නොවෙයි. විශේෂ පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ නම් -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා දන්නේ නැහැ නේ සිද්ධ වුණු දේ මොකක්ද කියලා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ඒ පිළිබඳව කලින් ඉල්ලීමක් කරලා කරන්න ඕනෑ. ඔබතුමාගේ වරප්‍රසාදය මොකක්ද කියන එකයි ප්‍රශ්නය.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් දණ ගැස්සවීම පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා, ඔබතුමාට අහිමි වුණු -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

පැහැදිලි කිරීම්වලට පිළිතුරු සපයන්න බැහැ. ඔබතුමාගේ නම සඳහන් කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංවිධායකතුමා -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

රීති කඩ කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා දණ ගැස්සවීම පිළිබඳව අපේ කනගාටුව, අපේ පක්ෂය වෙනුවෙන් මම මේ සභාව ඉදිරියේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට පිරිනමන්න කැමැතියි. හැබැයි එකක් මම කියනවා. මේ ප්‍රාදේශීය සභාවල තිබෙන වංචාව, දූෂණය, නීතිය, බලය අතට ගැනීම පිළිබඳව වහාම පරීක්ෂණයක් ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ පළාත් පාලන ආයතනවල තිබෙන, පළාත් සභාවේ පනත යටතේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් වශයෙන් ඉදිරිපත් කරන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පත් වෙන්න -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

සතොස පිළිබඳව වහාම මුදල් ඇමැතිතුමාට එරෙහිව පරීක්ෂණයක් කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කථා කරන්න පුළුවන් වුණේ නැත්නම් මිනී දෙකක් තුනක් ඔතැන මැරෙනවා. ඒ අනුව මම ස්තුතිවන්ත වෙනවා පොලිස්පතිතුමාට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් වශයෙන් මේ අවස්ථාවේදී කථා කරන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පොලිස්පතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. සභාවේ කථා කරලා, STF එක ගෙන්නලා මගේ කොඩි ගලවලා එතැන ඉරලා විසි කරලා දැම්මේ. ජයග්‍රහණය කරලා අපට තිබුණු ආවේගය හැටියට නීතිය බලය අතට අරගෙන වැඩ කරන්න කටයුතු කළේ නැහැ. අපි එහෙම කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වෙලාවක් දෙන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි වැඩ කළේ අපේ පක්ෂයේ -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මේ වරප්‍රසාද නොවෙයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ජාතික නායකතුමාගේ නිර්දේශය මත එතුමා ප්‍රකාශ කළා, නීතිය අනුව ක්‍රියාත්මක වෙන්න, බලය අතට ගන්නේ නැතුව වැඩ කරන්න කියලා. අන්න ඒ දේ මම මේ අවස්ථාවේදී, ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ මේ සභාව පාලනය කරන්න ඕනෑ එක්තරා රීති පද්ධතියක් යටතේ. ඒ රීතිය ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් සාධාරණ වෙන්න ඕනෑ. ආණ්ඩු පක්ෂය හරි, විපක්ෂය හරි රීති කඩ කරලා කටයුතු කරනවා නම්, මේ සභාව පාලනය කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත්, විපක්ෂයේ මන්ත්‍රීවරුත්, විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සංවිධායකතුමන්ලාත් තේරුම් ගන්න ඕනෑ සභාවේ ගරුත්වය ආරක්ෂා වන ආකාරයට ඒ රීති අනුව කටයුතු කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔබතුමාට වගකීම තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපක්ෂයේම මන්ත්‍රීවරු මූලාසනයට ගරු කරලා, මූලාසනයෙන් කියන දේට ඇහුම්කන් දෙන්න ඕනෑ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ නියෝගයට අවනත නොවෙනවා නම්, ඒ අවනත නොවී කරන ප්‍රකාශ කොහොමද හැන්සාඩ් වාර්තාවේ වාර්තාගත වෙන්නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ 34 (3) කියන වගන්තිය යටතේ පැහැදිලිවම කියනවා, පෞද්ගලික පැහැදිලි කිරීමක් ගැන විවාදයක් ඇති කර ගන්න බැහැයි කියලා. දැන් මේ රීතිය අමු අමුවේ උල්ලංඝණය කරනවා. ඒ රීති උල්ලංඝණය කරමින් කරපු ප්‍රකාශය හැන්සාඩ්ගත වෙනවා. මොකක්ද මේ නීතිය?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපැත්තේම මන්ත්‍රීතුමන්ලා ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කියපු කථාවට ඇහුම්කන් දෙන්න වෙනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රකාශයේදී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්ද ගරු මන්ත්‍රීතුමා?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔව්. 36 (1) යටතේ. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ප්‍රකාශයේදී පළමුවෙන්ම කියැවුණා මීරිගම ගැන. මගේත් මුහුණ බලාගෙන කිව්වේ. ඒ වාගේම එතුමාගේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රී රුවන් රණතුංග මැතිතුමාත් මට දුරකථනයෙන් කථා කළා. අර මීරිගම ප්‍රශ්නය වුණු එක ගැන. විශේෂයෙන්ම ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කළොත් හොඳයි. ගරු ප්‍රධාන ඇමැතිතුමා කියපු විධියට මගෙත් මුහුණ බලාගෙන කිව්වේ. මම ඒ නිවස ගිනි තියපු හැටියට.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අනේ නැහැ. සමාවෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

විශේෂයෙන්ම මම ඉල්ලීමක් කරන්නේ, ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කරන්න ඕනෑ. මොකද, එතැන මොකක්ද

[ගරු උදේන විජේරත්න]

වුණේ කියන එක ගැන හොඳට හොයලා බැලුවොත් හොඳයි. එතැන ඡන්ද කාලයේ ගෙනාපු සිල් රෙදි, සාරි, හැට්ට හරියට බෙදන්නේ නැතුව තිබුණු නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නම් විතරයි අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

විශේෂයෙන්ම ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කරලා, කවුද ගිනි තිබ්බේ කියන එක ගැන පරීක්ෂණයක් කරලා ඒක මම කළාය කියලා ඔප්පු වුණොත් ඇත්ත වශයෙන්ම මම මගේ පළාත් සභා මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වෙනවා. එහෙම නැත්නම් ඒ අයගෙන් ඔප්පු වුණොත් ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉල්ලා අස් වෙන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එහෙම කථාවක් කිව්වේ නැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා මගේ දිහා බල බලගෙන නේ කිව්වේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වැරැදි අදහසක්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ ගැන වාද විවාද වෙන්න අවශ්‍යතාවයක් නැහැ. ඒ ගැන සාධාරණ පරීක්ෂණයක් කරන්න කියලා තමයි මම මීරිගම පොලිස් ස්ථානයෙනුත් ඉල්ලා සිටින්නේ. ඒ වාගේම විශේෂයෙන්ම මට ලැබෙන පළාත් සභා අරමුදල්වලිනුත් මම ඒ නිවසටත් මුදල් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා කවදාවත් අසාධාරණ ලෙස දේශපාලන පළිගැනීම් මීරිගම කවදාවත් වෙලා නැහැ. මගේ මීරිගම බල ප්‍රදේශයේ එහෙම එකක් වෙන්න ඉඩ තියන්නේත් නැහැ. ඒ වාගේම විශේෂයෙන්ම සමූපකාර අංශයේත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා අවස්ථාව දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

දෙවැනි වරප්‍රසාද ප්‍රශ්නය. සමූපකාර අංශයේත් විශේෂයෙන්ම දූෂණ, වංචා සිදු වෙනවා. ඒ ගැන විශේෂයෙන්ම කොමසාරිස්තුමා දැනුවත් කරලා කොමසාරිස් පාලනයක් දාන්න. දැනටත් එහි මුදල් අයුතු ලෙස පාලනය -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවස්ථාව දෙන්න බැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

කරගෙන යනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. වාඩිවෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

වරප්‍රසාද ප්‍රශ්නයක් තමයි. අපේ සභාවේ අමාත්‍යාංශයක් මේ සමූපකාරය. ඒ නිසා ඒකේ මුදල් නාස්ති වෙනවා. ඒ ගැන ප්‍රකාශ කළේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය කාලය තුළම අපේ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ අය මට චෝදනා කළා බොරු කියනවා, චරිත ඝාතනය කරනවා කියලා. ඔබතුමාට මතක් කරලා දෙන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීගමුවේ

ජනතාව ඉතාමත් පැහැදිලිව තීන්දුවක් දුන්නා. ඒ වාගේම කැලණියේ ජනතාවත් ඒ තීන්දුව දුන්නා - (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වරප්‍රසාද

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොලොන්නාවේ ජනතාවත් කුඩුවලට විරුද්ධව පැහැදිලිව ඒ තීන්දුව දුන්නාය කියන එක මතක් කරලා දෙනවා. ඒ නිසා අපට චෝදනා නඟන්න එපා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ශබ්ද නඟා කථා කරන්න බැරි වීම ගැන මුලින්ම සමාව ඉල්ලනවා. පසුගිය 26 වැනිදා බේරුවල මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ, ජනාධිපතිවරණයේ ප්‍රධාන රැළිය දිනයේදී රාත්‍රී භෝජන සංග්‍රහය සංවිධානය කරලා තිබුණේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට ගැටළුවක් නම් පමණක් ඉදිරිපත් කරන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මාගේ ගැටළුව එක වචනයකින් කියන්න බැහැ. වුණු දේ කියන්න ඕනෑ. ඒ නිසා කරුණාකරලා සවන් දෙන්න. මොකක්ද කියලා ඊට පස්සේ කියන්න. ප්‍රශ්නයක් තියෙනවාද, නැද්ද කියලා. රාත්‍රී භෝජන සංග්‍රහය සංවිධානය කරලා තිබුණේ මගේ නිවසේ. 9.30 ට මේ සභාව නියෝජන කරන හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමියත්, හිටපු ජනාධිපතිතුමියත් - මම හිතන්නේ එතකොට මේ අයගේ ජනාධිපතිනිය වෙලා හිටියේ. දැන් අනුශාසක වෙලා ඉන්නකොට ප්‍රශංසා මුඛයෙන් කථා කරන අය, අපි හැමදාම කථා කළේ ඒ විධියට. අපි අදත් ගරු කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වුණු අසාධාරණය ගැන කිව්වා නම්, හොඳයි.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගෙදර කෑමට එනකොට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කෙටියෙන් කියන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෙටියෙන් කියන්න බැහැ. පැය තුනක් ගහනවා. පැය තුනක් එක දිගට ගහනකොට කෙටියෙන් කියන්න බැහැ. ඒ නිසා කරුණාකරලා සවන් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් පස්සේ අවස්ථාව දෙන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බැහැ, බැහැ. වරප්‍රසාද ප්‍රශ්නයක්. මට පස්සේ කථා කරන්න බැහැ. මම අසනීපයෙන් ඉන්නේ. 9.30 වනකොට හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමියයි, හිටපු ජනාධිපතිතුමියයි මගේ ගෙදර කෑමකට ගියේ. මමත් එතකොට හිටියේ වේදිකාවේ. බේරුවල නගරයේ. මගේ ගේ තියෙන්නේ මීටර් 500 ක් එහායින්. ගෙදර ඔක්කෝම හිටියේ කාන්තාවෝ. මේ කාන්තාවෝ ඉන්නකොට බේරුවල නගරාධිපතිතුමායි, හිටපු නගරාධිපතියි, තවත් ආධාරකරුවෝ පිරිසක් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

අත්අඩංගුවට අරගෙන තියෙනවාද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

අත්අඩංගුවට ගත්තාද නැද්ද කියන එකත් කියන්නම්. අත්අඩංගුවට ගත්තේ කොහොමද කියලාත් කියන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය දෙන්න බැහැ. ඉක්මන් කරන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ ප්‍රශ්නය. මට බාධා කරන්න එපා කියන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් කියන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එදා මගේ ගෙදරට ගහලා, ජනාධිපතිතුමියගේ වාහනවලට ගහලා, ගේ කුඩු කරලා ඔක්කෝම සිද්ධ වුණා. නීතිමය වශයෙන් පියවරක් ගත්තේ නැහැ. ඉන් අනතුරුව රැස්වීම ඉවර කරලා මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා - අපි හැමදාම කථා කළේ එහෙමයි. ඇමැතිතුමා කියලා. අතිගරු ජනාධිපතිතුමාත්, රාජිත සේනාරත්න ඇමැතිතුමාත් කැමට එන්න කියනකොට පොලීසිය ලව්වා කියවනවා, ආරක්ෂාවක් දෙන්න බැහැ. මෙතැනට යන්න දෙන්නත් බැහැ. ඒ තරම් බලයක් තියාගෙන මේ අය ගහනවා කියලා. නගරාධිපතිතුමායි, හිටපු නගරාධිපතිතුමායි. එතකොට මම ගෙදර එනකොට බේරුවල පොලීසියේ OIC මගේ ගෙදර හන්දියේ මීටර් 100 ක් එහා ඉඳලා මගේ වාහනයෙන් මාව බස්සලා කියනවා පයින් ගෙදර යන්න කියලා. වාහන නවත්තගෙන මාව පයින් යවනවා මගේ ගෙදරට. ආණ්ඩු බලය තිබෙන නිසා අපට මේවා කළේ. ඒ යනකොට මට ආරක්ෂාවට පොලීසියක් දෙන්නේ නැහැ. මාව රැකවරණයට එන්නේ බේරුවල නගර සභාවේ හිටපු විපක්ෂ නායකතුමා. තවත් මන්ත්‍රීවරු දෙතුන් දෙනෙක්. ආධාරකරුවන් හතර දෙනෙක්. ගෙදරට එනකොට වටකරගෙන ගහනවා. හත් දෙනාම තුවාල වෙනවා. මම දවස් තුනක් රෝහල්ගත වෙනවා. කිසිම පැමිණිල්ලක් නැහැ. ඒ නිසා මේවා ගැන අවධානය යොමු කරන්න වෙනවා. ආණ්ඩුව බලයට පත් වුණාම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යහපාලනය.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

යහපාලනය මතක් කරන්න වෙන්නේ. ඊයේ දිනයේදී උසාවියට දානවා. උසාවියට දානකොට පළමුවැනි නඩුව මොකක්ද? පසුගිය පළාත් සභා දිනයේදී, මාර්තු 30 වැනිදා මගේ ගෙදරට ගැහුවා. පළාත් සභා දිනයේදී. වාහන තුනක් කැඩුවා. ඒ නඩුවත් දානවා. මම හිතන්නේ පොලීසියෙන් එදා උසාවියට- පොලීසියට මාස 09 ක් 10 ක් ගත වෙනවා පළාත් සභා දිනයේදී ගහපු එකේ නඩුව උසාවියට නීතියක් හැටියට ගෙන එන්නට. මේවා ගැන පරීක්ෂණයක් ඉල්ලන්න වෙනවා. ඡන්දයට දවස් දෙකකට කලින් ඒ කියන්නේ මාර්තු 28 වැනිදා මගේ ගෙදරට ගැහුවා. වාහන දෙකක් කැඩුවා. අද වනකල් පරීක්ෂණයක් නැහැ. මම කොළඹ පොලිස් සහන මැදිරියේ පැමිණිලි හතක් දාලා තිබෙනවා. අද වනකල් එක පැමිණිල්ලකටයි ඊයේ නඩුව ගොනු කරලා තිබෙන්නේ. ඒ නිසා මේවා ගැන මට පරීක්ෂණයක් පවත්වන්නත් වෙනවා. මේවාට නොවෙයි යහපාලනය කියන්නේ. ඒ මදිවාට ඊයේ උසාවි ගිහිල්ලා ඇප අරගෙන එන එක නීතිමය ප්‍රශ්නයක්. මොන පාලනයක් වුණත් අපි නීතියට ගරු කරනවා. ඒ ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට, මම හිතන්නේ හෙට අනිද්දා මහ ඇමැති වෙන්න ඉන්න හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ගරු මන්ත්‍රීතුමිය - ඒ නිසා අපට මේවා ගැන දීර්ඝව කථා කරන්න බැරි මොහොතක කථා කරන්නේ. ඒ නිසා මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතිය.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු හර්ෂණ රාජකරුණා- විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Harshana Rajakaruna- Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මම අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. සුවිශේෂ ඓතිහාසික වෙනසක්. අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති කරවන්නටත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අගමැති කරවන්නටත් දැවැන්ත ශක්තියක් ගම්පහ දිස්ත්‍රික් ජනතාව මේ ජනාධිපතිවරණයේදී ලබා දුන්නා. විශේෂයෙන්ම ඒ සියලුම දෙනාට එක්සත් ජාතික පක්ෂය වෙනුවෙනුත්, පොදු විපක්ෂය වෙනුවෙනුත් අපේ ගම්පහ

දිස්ත්‍රික් ජනතාවට ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මම මේ වෙලාවේදී අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කරපු කාරණා කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරන්නත් කැමැතියි. අපි කවුරුත් මේ ජනාධිපතිවරණය ජයග්‍රහණය කළාම මහජන නියෝජිතයන් හැටියට පුළුවන්තරම් උත්සාහය යෙදුවා, යම් යම් ජනතාවගේ ආවේගයන් එක්ක සිදු වුණු සිදුවීම් පුළුවන්තරම් පාලනය කරන්න. නමුත් යම් යම් සිද්ධීන් කිහිපයක් සිදු වෙලා තිබෙන බව අපට දැනගන්න ලැබුණා. ඒ වෙනුවෙන් අපේ කනගාටුව ප්‍රකාශ කරලා ඒ අයට සාධාරණයක් සිදු වෙයි කියන විශ්වාසය අපේ තිබෙනවා. විශේෂයෙන්ම අද සුවිශේෂ අවස්ථාවක් තියෙන්නේ. ඒ තමයි අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ ජනාධිපති වෙලා, එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ අගමැති වෙලා තිබෙනවා. මේ ජාතික ආණ්ඩුවක් තුළදී මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් ආකාරයේ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, යම් යම් අඩුපාඩුකම් මේ දින කිහිපයේදී සිදු වෙලා තිබෙනවා නම් ඒක වහාම නිවැරැදි කර ගන්න. අපෙත් සම්පූර්ණ සහයෝගය අපි ලබා දෙන්න අපි කටයුතු කරන්න කැමැතියි.

ඒ වාගේම තමයි මේ රටේ දින 100 වැඩ පිළිවෙළට සියලු දෙනාම වාගේ එකතු වෙලා තිබෙනවා. නමුත් අපි විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න ඕනෑ මේ ඓතිහාසික වෙනස සිදු වෙන්නට පෙර පසුගිය ජනාධිපතිවරණ කාල සීමාවේදී අපේ පාක්ෂිකයන්ට විශාල අසාධාරණකම් සිදු වුණා. අපේ ආධාරකරුවන්ට විශාල වශයෙන් අසාධාරණකම් සිදු වුණා. අපි බලාපොරොත්තු වුණු ඒ සාධාරණය, දැන් කථා කරන යහපාලනය පිළිබඳව එදා විශාල වශයෙන් අමතක වීමක් සිදු වෙලා තිබෙනවා. ඉතින් මම හිතන හැටියට ඉදිරි අනාගතයේදී තිබෙන මැතිවරණය මීටත් වඩා සාධාරණ ලෙස කටයුතු කරයි කියන එක අපේ බලාපොරොත්තුව තිබෙනවා.

විශේෂයෙන්ම මම අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ, මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු ඒ නිලධාරී මණ්ඩලයට. එතුමන්ලා සුවිශේෂ ශක්තියක් ලබා දුන්නා, පුළුවන්තරම් සාධාරණ මැතිවරණයක් කරන්න. ඒ වාගේම අපි පිළිකුල් කරනවා විශේෂයෙන්ම රජයේ සමහර මාධ්‍ය, මේ පසුගිය මාස කිහිපය තුළම ඒ රජයේ මාධ්‍ය හැසිරුණු ආකාරය. අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ, සිරස මාධ්‍ය ආයතනය ඇතුළු විශේෂයෙන්ම පෞද්ගලික ආයතනවලට. විශේෂයෙන්ම සිරස මාධ්‍ය ආයතනය සුවිශේෂ කාර්යයක් සිදු කළා. මේ සාධාරණ පණිවිඩය රටට යන්න ඒ ආයතනය විශාල සේවයක් කළා. ඒ වාගේම මම බලාපොරොත්තු වෙනවා මේ රජයේ මාධ්‍ය ආයතන, එදා වුණු සිදුවීමම අද කරන එකක් නැහැයි කියලා. මොකද, එහෙම කළොතින් ජනතාව ඒ පණිවිඩය දෙයි. මම ඉල්ලීමක් කරනවා. අපට කරන්න පුළුවන් උත්සාහය අපි කරනවා. දැන් ඔබතුමන්ලා මහ ලොකුවට කියනවා නේ ඔබේ සභාපතිතුමා තමයි මේ රටේ ජනාධිපති කියලා. අඩුපාඩුකම් තිබෙනවා නම් ඔබේ සභාපතිතුමාත් එක්ක කථා කරගෙන, මේ ජනාධිපතිතුමාත් එක්ක කථා කරගෙන ඒවා නිවැරැදි කරන්න. මෙතැන ඇවිල්ලා ඔබතුමන්ලා කියනවා කියන්නේ, තමන්ගේ සභාපතිතුමාට, ජනාධිපතිතුමාට පිහියෙන් අනින එකයි. එදා කළා වාගේ. ඒක නිසා යම් ගැටළුවක් තිබෙනවා නම් සභාපතිතුමාත් එක්ක කථා කරන්න. සමහර වෙලාවට වෙලාවක් දෙයි. ඔබතුමාටත් අවශ්‍ය නම් ඒ කටයුත්ත කරන්න. ඉතින් මම අවසාන වශයෙන් ඔබ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික් ජනතාවට පුද කරනවා. සුවිශේෂ ජයග්‍රහණයක් කළා. ඒ වාගේම බස්නාහිර පළාත ගත්තොත් එහෙම දිස්ත්‍රික්ක තුනෙන් කොළඹ දිස්ත්‍රික්කයයි, ගම්පහ දිස්ත්‍රික්කයයි යන දිස්ත්‍රික දෙක අපට ජයග්‍රහණය කරන්න පුළුවන් වුණා. ඒ සඳහා මූලිකත්වය ගත්තු සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක තිබෙනවා. මේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ පක්ෂයේ සභාපතිතුමා ජනාධිපතිතුමා නොවෙයිද කියලයි දැන ගන්න ඕනෑ. කවුද නැහැයි කියන්නේ? (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපේ තමයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

ඔබතුමාගේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමන්ලාගේ සභාපති. අපේ ජනාධිපති.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා අනවශ්‍ය ගැටළුවක් වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala- Leader of the Opposition

මම දන්න විධියට ඔබතුමන්ලා බ්‍රහස්පතින්දා හම්බ වෙනවා නේ? හම්බ වුණු වෙලාවට ඒ යෝජනාව එතුමාට කියන්න. නැත්නම් අපි කියන්නම්. මෙන්න මේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලාගේ සභාපති විතරයි. අපේ ජනාධිපති.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සම්පත් හොරා කෑවා නම්, ඒ ඕනෑම කෙනෙකුට දඬුවම් කරන්න ඕනෑ. ඒක සාධාරණයි. අල්ලස් කොමිෂන් එක පිහිටෙව්වාට පස්සේ 2001 ඉඳලා වංචා දූෂණ හෙළිදරව් වුණා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපක්ෂයේම ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලැම්බෝගිනි, කාර් රේස්, හොරකම්, වංචා, දූෂණ පෙන්න පෙන්න තියෙද්දිත් අවංකව ලක්ෂ 58 ක ඡන්ද ප්‍රමාණයක් මහින්ද රාජපක්ෂ මැතිතුමාට පාවිච්චි කරපු ඒ ජනතාවට අපේ ගෞරවය, ප්‍රණාමය පුද කරන්න ඕනෑ. මේ මාධ්‍ය සියල්ලෙන්ම. (බාධා කිරීමක්)

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

දැන් ඉල්ලුවොත් ඒ ටිකවත් හම්බ වෙන්නේ නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඔබතුමා කට වහගෙන ඉන්න පොඩ්ඩක්. අර කැගහන එක සිරසේ දාන්න. ලක්ෂ 57 ක් ඡන්දය දුන්නු ඒ ජනතාවට, අපේ ගෞරවය, ප්‍රණාමය පුද කළ යුතු වෙනවා. බහුතර ජනතාවගේ බහුතර කැමැත්තත්, සුළුතර ජනතාවගේ බහුතර කැමැත්ත නොලැබීම තුළ අපට ඒ ජනාධිපතිකම ගිලිහී ගියත් ලක්ෂ 58 ක් ගෙඩිය පිටින් දුන්නු ජනතාවට අපේ ප්‍රණාමය පුද කරනවා. මේ කට්ටිය කෑ ගහනකොට මට එක කථාවක් මතක් වෙනවා. අපේ ගෙවල් ගාව හිටියා එක පවුලක්. ඒ පවුලේ අම්මා වෙන මිනිහෙක් එක්ක පැනලා ගියා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

අලියා කෝ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

පැනලා ගිහිල්ලා ළමයෙක් හදාගත්තා. හදාගත්තාට පස්සේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඇතා කෝ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඇතා නොවෙයි. ඇතින්නක් ඉන්නේ. එන්න දෙන්න. හැබැයි පැටව් තුන්දෙනෙක් ඉන්නවා. තුනම දෙන්නම්. එන්න. ඒ නිසා වැරදි දේවල් කියන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විජයමුණි මන්ත්‍රීතුමා ඒ ගැන හොඳට කිව්වා. ඔබතුමා බයිලා කියන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

තාත්තාගේ නම්බුව තියාගෙන ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඊට පස්සේ අම්මා පැනලා ගිය වෙලාවේ ඉඳලා ගෙදර නෑදෑයෝ, ළමයින් ඔක්කෝම අම්මාට බැණ බැණ හිටියා. අම්මා පැනලා ගියා නේ? ළමයා හම්බ වුණා විතරයි අම්මා ෂෝක් ළමයා කියලා එක්කරගෙන ඇවිල්ලා තාත්තාව එලෙව්වා. දැන් තාත්තා මහ පාරේ. ළමයි ගෙදර. අම්මත් එක්ක. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක තමයි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මේ පොඩ්ඩක් ඉන්න. කියන දේ අහගෙන ඉන්න. ඊට පස්සේ තාත්තා එලවලා අම්මාව ගෙනාවා. අම්මා හිතුවා ඉස්සර අම්මා තමයි කියලා. දැන් අම්මා එයා නොවෙයි. ආදරේ අලුත් ළමයාට. පරණ නෑදැයෝ ගෙනැල්ලා ඉඩ කඩම් බෙදලා දුන්නා. අර පරණ උන්ට මොනවත් නැහැ. ඊට පස්සේ උන් කෑගහනවා. ඒක තමයි මේ ආණ්ඩුවේ මෛත්‍රීපාල පස්සේ යන කට්ටියට වෙන්නේ. මෛත්‍රීපාල ජනාධිපතිතුමා පස්සේ යන අයට -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

හිතාගෙන ඇති නේද අපි ලේසියෙන් අත අරියි කියලා. අනේ මේ නිකන් ඉන්න. ඔබතුමා හිතන් ඉන්නවාද අපේ කර පිටින් ඇවිල්ලා අපි නිකන් අත අරිනවා කියලා. අනේ මේ නිකන් ඉන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වෙනවා කියන්නේ, අපේ නායකතුමා අගමැති වෙනවා කියලා අවඥාවෙන් හිනා වුණේ. මොකද වුණේ? ආණ්ඩු කරන්නේ අපේ නායකතුමා. ඒක තේරුම් ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

කවුද ඔයාලගේ නායකතුමා?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අපේ නායකයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය මොකද කළේ? අම්මත් එක්ක ළමයා ගෙනැල්ලා - (බාධා කිරීම්) දැන් ඒ පරණ අම්මා නොවෙයි. දැන් ඒ අයගෙන් සැලකිලි බලාපොරොත්තු වෙන්න එපා. ඒ නිසා තමයි ගුටි කනකොට ජනාධිපතිතුමාට කථා නොකර ඉන්න වෙලා තිබෙන්නේ. පරණ අම්මා කියලා හිතාගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය වැඩ කරනවා නම් ඒක තමයි පළමුවැනි වැරැද්ද. ඒ නිසා අපි කියනවා, අර වාමාංශික නායකයෝ වාගේ කොන්ද කෙළින් තියාගෙන තමන්ගේ ප්‍රතිපත්තිය කියලා විපක්ෂයේ වාඩි වෙන්න. රෙද්දක් ඇඳගෙන ඉන්න පුළුවන් නම්. මෛත්‍රීපාල ජනාධිපතිතුමාට විරුද්ධව වැඩ කරලා. එතුමාට විරුද්ධව ගහන්න පුළුවන් මඩ ඔක්කෝම ගහලා ඉවර වෙලා දැන් එතුමාගේ රෙදි හෝදන්න -

[සභාවේ ඝෝෂා]

කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

ඔය උපාලි කොඩිකාර ඇමැතිතුමාට කියන්නේ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම එකා වාගේ හිටියා. දෙන්නෙක් තුන්දෙනෙක් ගෙම්බෝ වාගේ පැන්නාට අනෙක් ඔක්කෝම අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එක්ක අපේ බස්නාහිර පළාත් සභාව ආරක්ෂා කළා. මුළු ලංකාවේම පළාත් සභා මන්ත්‍රීවරු පැනලා - අපි ආණ්ඩුවේ. ඒ නිසා අපි ගරු කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට. දෙතුන් දෙනෙක් පැන්නා. ආණ්ඩු බලය තියාගෙන මෙය ආරක්ෂා කිරීම පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

අපි ආදර්ශයක් දීලා තිබෙනවා. අනෙක් පළාත් සභා ඔක්කෝම පෙරලෙද්දී අපි මේවා අවසන් වෙනකල් අපේ පළාත් සභාව, ආණ්ඩුව වශයෙන් අපි පාලනය කරනවා. ඒ නිසා අද නොයෙක් චෝදනා කරමින්, බොරුවට TV වල දාලා අශ්ව පැටව්, ලැම්බෝගිනි කියලා නිකම් නිසාන් කාර් පෙන්වමින් මේ මිනිස්සුන්ගේ මනස වියවුල් කරලා මේ යන ගමන (බාධා කිරීමක්) එක මිනිහෙක් හරි ගෙන එන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා වැරැදි කරපු අර රවී කරුණානායකලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අත්පුඩි ගැහුවේ ඇයි?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒකයි තමුන්නාන්සේලාගෙන් යහපාලනයක් බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපේ හමුදා බුද්ධි අංශවලට නැවත වතාවක් කණ කොකා හඩන යුගය උදා වෙලා තිබෙනවා. අර නැව්වල මේ තිබෙන ආරක්ෂක උපකරණ, අවි ආයුධ පෙන්වමින් කුට උපක්‍රමයක් ක්‍රියාත්මක කරනවා, අපේ හමුදා අඩපණ කරන්න. අද උතුරු - නැගෙනහිර හමුදා කැම්ප් වලට සීමා කරලා තිබෙනවා. අද පෙට්‍රල් යන්නේ නැහැ. ජනතාවට මේවා වහන් කරගෙන කරන්න යන ක්‍රමය -

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

බොරු කියන්න එපා. නොමඟ යවන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු කියන්න දෙන්න බැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ නිසා අපි කියන්නේ, අපේ ආණ්ඩුවේ ඉඳලා අවුරුදු ගණනක් ඇමැතිකම් කරපු -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

රටේ ආරක්ෂක ඇමැති කියනවා, හමුදා ප්‍රකාශකත් කියනවා. මෙතුමා මොනවාද මේ කියන්නේ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

විපක්ෂයට ඇවිල්ලා මේ එක්සත් ජාතික පක්ෂය ඉවර කරන්න ලැහැස්ති වෙන්න කියන ඉල්ලීම කරමින්, අපට ඡන්දය පාවිච්චි කරපු සියලු දෙනාටම දෙවියන්ගේ ආශිර්වාදය ලබා දෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

උතුරු - නැගෙනහිර ගැන කථා කරනවා. කේ.පී. ව භාර දෙන්න කෝ? මහින්ද රාජපක්ෂ කේ.පී. ව හංගගෙන ඉන්නේ. කේ.පී. ව දෙන්න.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ජාතිවාදය අවුස්සනවා. ඒවා වළක්වන්න. ඒවාට ඉඩ දෙන්න එපා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ජාතිවාදය අවුස්සන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හංගන් ඉන්න කොටියාව දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තූතියි. විශේෂයෙන්ම අපි දන්නවා, පසුගිය මැතිවරණය ජයග්‍රහණය කරලා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ වාගේම අපේ පක්ෂ නායක අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා - අපේ ජනාධිපතිතුමාටත්, ඒ වාගේම අපේ අගමැතිතුමාටත් සුභ පතනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දන්නවා මේ මැතිවරණ ව්‍යාපාරය, ඉතාම අමාරුවෙන් ජයග්‍රහණය කරපු මැතිවරණ ව්‍යාපාරයක්. මේ මැතිවරණ ව්‍යාපාරය මුල ඉඳන්ම මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට විරුද්ධව - විශේෂයෙන්ම අපි දන්නවා ආණ්ඩුව සැලසුම් සහගතව, ද්වේෂ සහගතව මඩ ප්‍රචාර යොදා ගනිමින්, ඒ වාගේම ආණ්ඩුවේ තිබුණු රාජ්‍ය බලය, මැර බලය මේ සියලු දේවල් යොදලා අපි විපක්ෂයේ ඉඳගෙන ඉතාම අමාරුවෙන් ගමනක් ගිහිල්ලා ජයග්‍රහණය කරපු මැතිවරණයක්. මේ මැතිවරණය හරහා ජනතාවට අපි පොරොන්දු දුන්නා. විශේෂයෙන්ම මේ රටේ යහපාලනය ගොඩ නගනවා, මේ රටේ නීතියේ ආධිපත්‍ය මේ රටේ නැවත ඇති කරනවා. ඒ වාගේ පොරොන්දු ගණනාවක් අපි මහජනතාවට දීලා තමයි මේ බලය ගත්තේ.

ගරු සභාපතිතුමනි, අපි කියන්න ඕනෑ අද වන කොට මේ රටේ මේ පසුගිය ආණ්ඩුවේ හිටපු ඇමතිවරුන්ට චෝදනා රාශියක් එල්ල වෙලා තිබෙනවා. අද වන කොට වංචා හා දූෂණ විමර්ශන ආයතනයට චෝදනා එල්ල වෙලා තිබෙනවා, ඇමතිවරුන් රාශියකට විරුද්ධව. ඒ වාගේම හිටපු ජනාධිපතිතුමා ඇතුළු එතුමාගේ පවුලේ උදවියට මේ රටේ තිබුණු මුදල් පිළිබඳව, මේ රටේ තිබුණු -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මුදල් ඇමතිතුමාට නඩුවකුත් තිබෙනවා. විදේශ විනිමය වංචා නඩුවක්. මුදල් ඇමතිතුමාට විදේශ විනිමය වංචාවක් තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ වාගේම ජනතාවගේ සම්පත් පිළිබඳව, ඒ රාජ්‍ය සම්පත් කොල්ල කෑම පිළිබඳව විශාල චෝදනා ගණනාවක් හිටපු ජනාධිපතිතුමාගේ පවුලට අද එල්ල වෙලා තිබෙනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

මුදල් ඇමතිතුමාගේ නඩුවේ තීන්දුව දෙන්නේ ඔයගොල්ලොන්ගේ අතුරු අයවැය දිනයේදී.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ආණ්ඩුව අවුරුදු 10 ක් තිබුණා. ඒ කාලේ මොනවා හරි කරන්න තිබුණා නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න දෙන්න.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, ඒ වාගේ දේශපාලන නායකයන්ට මේ චෝදනා එල්ල වන ගමන්ම මේ දේශපාලන නායකයන්ගේ ආධාර මත, ඔවුන්ගේ උදව් මත හොරකම් කරපු නිලධාරි පැලැන්තියක් ඉන්නවා. ඒ නිලධාරි පැලැන්තියේ අමාත්‍යාංශ ලේකම්වරු ප්‍රමාණයක් ඉන්නවා. ඒ වාගේම කුඨ ව්‍යාපාරිකයන්. ජාවාරම්කාරයෝ. මේ පසුගිය ආණ්ඩුවේ උදව් අරගෙන මේ ජනතාවගේ මුදල් අයුතු ලෙස කොල්ල කාපු ව්‍යාපාර පැලැන්තියක් මේ රටේ ඉන්නවා.

මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම කැසිනෝ අයිතිකාරයෙක් වන, පසුගිය අමාත්‍යාංශයක ලේකම්වරයෙක් හැටියට වැඩ කරපු ධම්මික පෙරේරා මහත්මයා. ඒ මහත්මයා මේ රටේ ජනතාවගේ මුදල් - මේ ආණ්ඩුවේ හිටපු නායකයන්ගේ ආධාර මත විශාල මුදල් කන්දරාවක් කොල්ල කෑවා. ඊළඟට ඒ ධම්මික පෙරේරා මැතිතුමාත් එක්ක නිමල් පෙරේරා මැතිතුමා ඉන්නවා. එතුමාත් මේ රටේ විශාල මුදල් කන්දරාවක් කොල්ල කෑවා. ඊළඟට පී.බී. ජයසුන්දර. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා. මම හිතන්නේ එතුමා අද මේ රටෙත් නැහැ. අද රටින් පැනලා ගිහිල්ලා. එතුමා පසුගිය කාලයේ හිටපු ජනාධිපතිතුමාගේ ආධාර මත විශාල ලෙස මුදල් කොල්ල කෑවා. ඊළඟට ප්‍රේමසිරි මහත්මයා ඉන්නවා. RDA එකේ Chairman වෙලා සිටියා. Highway එකේ Secretary වෙලා සිටියා. ඊළඟට වරාය අධිකාරියේ ලේකම් වෙලා සිටියා. ජල සම්පාදන මණ්ඩලයේ සභාපති වෙලා සිටියා. එතුමා විශාල වශයෙන් මුදල් දූෂණය කරලා තිබෙනවා. ජනතාවගේ මුදල් කොල්ල කාලා තිබෙනවා. ඊළඟට ගාමිණී සෙනරත්. ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්. ඔහු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනය යටතේ ආයතන 10 ක සභාපති වෙලා ඉඳලා තිබෙනවා.

ඊළඟට මේ රටේ කුඨ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් ඉන්නවා. මේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පවුලේ උදව්වෙන්, එතුමන්ලාගේ ඒ පවුලේ සාමාජිකයන්ගේ උදව්වෙන් මුදල් හම්බ කරපු අය ඉන්නවා. ජාවාරම්කාරයෝ ඉන්නවා. කවුද? තිරුකුමාර් නඩේෂන්. ජවාරම්කාරයෙක්. මේ ආණ්ඩුවේ ඉඳගෙන, ආණ්ඩුවේ දේශපාලන නායකයන්ගේ උදව් මත මුදල් හම්බ කළා. ඊළඟට නොයෙල් වෙදනායගම්. සෙනොක් ආයතනයේ සභාපති. එතුමාත් මේ රාජපක්ෂ පවුලේ උදව්වලින් විශාල වශයෙන් මේ රටේ ජනතාවගේ මුදල් කොල්ල කාපු කුඨ ව්‍යාපාරිකයන්. මෙන්න මේ වාගේ නිලධාරීන් විතරක් නොවෙයි. ව්‍යාපාරිකයන්, දේශපාලන නායකයින් විතරක් නොවෙයි. පසුගිය ආණ්ඩු සමයේ රාජක්ෂ පාලනය යටතේ මේ ජනතාවගේ මුදල් හම්බ කරපු, මුදල් කොල්ල කාපු, ජනතා සම්පත් ගසා කාපු, අයුතු ලෙස මුදල් හොයපු මේ ලේකම්වරු, රජයේ නිලධාරීන්, ඒ වාගේම කුඨ ව්‍යාපාරිකයන්වත් මේ අල්ලස් හා දූෂණ එක ඉදිරියට ගෙනැල්ලා, නීතියේ දඬුවමට ලක් කළ යුතුයි කියලා අපි මේ නවරජයෙන් බලාපොරොත්තු වෙනවා. අපි ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොවුන්ට පැන යන්න දෙන්න එපා. මොවුන්ව වහාම නීතිය ඉදිරියට ගේන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.42 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Sitting, suspended temporarily and it resumed at 11.42 a.m with Hon. Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. RoiseVijitha Fernando

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඔබතුමාගේ ගෞරවණීය අවධානය යොමු කරනවා. දැන් සුළු මොහොතකට පෙර ඉතාමත් අවාසනාවන්ත සිදුවීමක් සිද්ධ වුණා. මම ආහාරපාන සඳහා පල්ලෙහාට යද්දී කලිසමක් ඇඳ ගත්තු රැවුල වවාගත්තු මනුස්සයෙක් ඉස්සරහාට ආවා. ඇවිල්ලා, මගෙන් ගත්තු ලක්ෂ 37 කෝ කියලා. ඒ මනුස්සයා කියාගෙන කියාගෙන ගියා. මම ඇහුවා, කවුද ඔයා කියලා. මම මීගමුවෙන් ආවේ. පස්සේ මම අහපු හරස් ප්‍රශ්නය ඉදිරියේ ඔහු අඩපණ වුණා.

වෙව්ලන්න ගත්තා. මනුස්සයා ගියා. (බාධා කිරීම්) මම - ඉන්න කියන්න. ඉන්න කියන්න. මනුස්සයා ගියා. ඒ අතරතුරේ එයා කිව්වා, මම CID එකේ පැමිණිලි කරලා තිබෙනවා. මීට අවුරුදු 07 කටද, 08 කටද ඉස්සෙල්ලා. දැන් පැන නඟින ප්‍රශ්නය අවුරුදු හතකට, අටකට ඉස්සෙල්ලා CID එකේ පැමිණිල්ලක් කරලා තිබෙනවා නම්, මගෙන් කට උත්තරයක් හෝ මා අත්අඩංගුවට ගැනීමක් සිදු වෙන්න ඕනෑ. එයා මීගමුවේ නම් මාව හම්බ වෙන්න එයාට මෙහාට එන්න අවශ්‍යතාවයක් නැහැ. මාව මීගමුවේ හම්බ වෙන්න පුළුවන්. මම කිව්වා, මම ඔයාව දැක්කේ අදයි. ඔයා කවුද? මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා. මේවා අර මුලතිව්, කිළිනොච්චිවල ගහද්දී කොළඹ බෝම්බ පිපිරුවා වාගේ තමයි. මම ගහන්න ගත්තේ බීච් පාක් එකටයි. මීගමුවේ ඒ කප්පම් ගන්න සිද්ධිවලටයි. තව මම ඇද්දේ නැහැ, ගරු සභාපතිතුමනි. ව්‍යාපෘති පටන් අරගෙන, ව්‍යාපෘතියක් නැතිව සල්ලි කෝටි ගණන් ගෙවපුවා තිබෙනවා. තව රාජපක්ෂ උද්‍යානයේ කප්පම් සිද්ධි තිබෙනවා. මේ වාගේ සිද්ධි ගොඩාක් තිබෙනවා. ඉතින් මේක පිටිපස්සේ කෙනෙක් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම ඒ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම සොයා බලන්නම්.

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. Roise Vijitha Fernando

විශේෂයෙන්ම මේ පරිශ්‍රයට ඇතුල් වුණේ කොහොමද කියලා. එයාගේ නමත් කිව්වා, අමනුල්ලා ද මොකක්ද කියන නමක්. ඒ නිසා ඉතාමත්ම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා. මේකට ඇතුල් වුණේ කොහොමද? මේ පුද්ගලයා කවුද කියන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සිද්ධිය පල්ලෙහාදී ද වුණේ?

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. RoiseVijitha Fernando

ගරු සභාපතිතුමනි, පල්ලෙහා ලිෆ්ට් එක ළඟින් යද්දී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලිෆ්ට් එක ගාවදී නේද?

**ගරු රොයිස් විජිත ප්‍රනාන්දු**
Hon. RoiseVijitha Fernando

මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම මම ඒ ගැන සොයා බලන්නම්.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. පළාත් සභාවේ මට වෙන් වූ ප්‍රතිපාදන සියල්ල කපා හරින්න කියලා ලියුම් එවලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට. මේ ගැන සොයා බලලා මට සාධාරණය ඉෂ්ට කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, පළාත් සභා අරමුදල්ද? වෙන අරමුදල්ද?

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ආර්ථික සංවර්ධන යටතේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒවා ඔක්කොම කපා හැරලා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

බඩු ගත්ත ඒවා හිටන් සියල්ල අයින් කරලා තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒවා අසාධාරණ ලෙස දුන්නු ඒවා. දැන් රාජපක්ෂලා නැහැ නේ. ඒකයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒවා -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු මහ ඇමැතිතුමා, බඩු ගෙනැල්ලත් තිබෙනවා. ඒවා නිදහස් කරන්න දෙන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ වරප්‍රසාද ප්‍රශ්නය මම හිතන්නේ, පළාත් සභා අරමුදල්වලින් නම් කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒවා බෙදන්න පුළුවන්. නමුත් සමහර ප්‍රතිපාදනවලින් ගෙනාපු බඩු කාටවත් හම්බ වුණේ නැහැ. කිසි මන්ත්‍රීවරයෙකුට බෙදා දෙන්න හම්බ වුණේ නැහැ. ඒ බඩු ටික එහෙම්මම ඒ තැන්වල තිබෙනවා.

එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, කොළොන්නාව ප්‍රදේශයේ ගැටලු පිළිබඳව අදහස් දැක්වීමට ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මුලින්ම මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, කොළොන්නාව මැතිවරණ කොට්ඨාශයේ අපේ පියවරුන්, සහෝදරයින්ව දිරාපත්වන සිරුරු බවට පත් කරන්න පසුගිය ආණ්ඩුව කාලයේදී ගත්තු උත්සාහයට විරුද්ධව මෛත්‍රී පාලනයක අරුණාලෝකය දැල්වීම සඳහා අපි කරපු ආරාධනය පිළිඅරගෙන වැඩි ඡන්ද 17,068 කින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දුන්නු කොලොන්නාව ආදරණීය ජනතාවටත්, කොළඹ දිස්ත්‍රික්කයෙන්, එක් ලක්ෂ හැට අට දහස් හාරසිය පනස් නවයක වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා දුන්නු කොළඹ දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවටත් ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, ගරු සභාපතිතුමනි මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට -

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ඒ හිරුණිකා ගරු මන්ත්‍රීතුමියටයි, ප්‍රසන්න සෝලංගආරච්චි සභාපතිතුමාටයි පිංසිද්ධ වෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කොලොන්නාව ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා හැටියට අපි -

**ගරු රසික මංජුලබුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ඔබතුමාගේ දක්ෂතාවයක් නොවෙයි ඒක.

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ කොලොන්නාව මැතිරණ ප්‍රදේශයේ බලයලත් නියෝජිතවරයා හැටියට අපි මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය කරන කොට - ගරු මහ ඇමැතිතුමා මේක දැනගත්තොත් හොඳයි. සාමකාමී මැතිවරණ තිබ්බයි කියන කට්ටිය, සාමකාමීව මැතිවරණ වේදිකා හැදුවයි කියපු කට්ටිය දෙසැම්බර් මාසේ 20 වැනිදා කොටිකාවත්ත හන්දියේදී මගේ කණ්ඩායමකට කඩුවලින් කොටලා, එක්කෙනෙක් තවමත් එක්තැන් වෙලා ගෙදර ඉන්නවා. ඊට පස්සේ අපේ ප්‍රධාන මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තිබුණු 24 වැනිදාට කලින් දවසේ රාත්‍රියේ අපි සරසද්දී, ඒ පළාතේ මේ සභාවේ හිටපු ගරු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ඇවිල්ලා මම ඉන්න තැන වේදිකාවට වෙඩි තිබ්බා. ඊට පස්සේ වෙඩි වරුෂා මැද, (බාධා කිරීමක්) අපි මේ රැස්වීම කර ගෙන ගියාට පස්සේ, ආයේ දවස් දෙකකින් පස්සේ මගේ කාර්යාලයට ඇවිල්ලා වෙඩි තිබ්බා. පොලීසිය බලන් ඉද්දී, හමුදාව බලන් ඉද්දී වෙඩි තිබ්බේ. මම පොලිස්පතිතුමාට ලිඛිතව ලියුමක් යැව්වා. මට ආරක්ෂාව ලබා දෙන්න. තමුන්නාන්සේ වගකීම භාර ගන්නවද කියලා. මොකද හේතුව? මගේ ගෙදර ළඟට අංක තහඩු රහිත ඩිපෙන්ඩර් රථ යොදවලා මේ මැතිවරණ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩාකප්පල් කරන්න උත්සාහ කළා.

විශේෂයෙන්ම කියන්න ඕනෑ. මැතිවරණ කොමසාරිස්තුමාගේ ලිඛිත නියෝගයෙන් පොලිස් නිලධාරීන් දෙදෙනෙකුගේ ආරක්ෂාව ලබා දීලා, දවස් පහක් යනකොට ඉහළ නියෝගයක් කියලා මගේ ආරක්ෂාව ඉවත් කළා. නැවත මම මැතිවරණ කොමසාරිස්තුමාට ලියුවාම, මම ළඟ ඒ සියලු ලියකියවිලි - මම ඒවා සියල්ල සභාගත කරනවා. මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රමුඛයි, දැන්ම ඉතා හදිසියි. ප්‍රමුඛ අවධාය සඳහා කියලා පොලිස්පතිවරයාට නියෝගයක් ලබා දෙනවා, වහාම ආරක්ෂාව ලබා දෙන්නය කියලා. ඒත් ලබා දුන්නේ නැහැ. ඊට පස්සේ මැතිවරණ කොමසාරිස්තුමා නැවත කියනවා. එතුමාගේ නියෝගය

පිළිපැදලා නැහැයි කියලා පොලිස්පතිතුමාට ලියනවා. නියෝගය පිළිපැදලා නැහැ. ඒ නිසා යම්කිසි සිද්ධියක් පැන නැඟුනහොත් ඒ තත්ත්වයේ වගකීම පොලිස්පතිවරයා භාර ගන්න ඕනෑය කියලා. මෙන්න මෙහෙමයි මේ අය මැතිවරණය කළේ. එහෙත් අපි ජනතාවත් එක්ක එකතු වෙලා ප්‍රජාතන්ත්‍රවාදී විධියට මැතිවරණය කරලා තමයි ජයග්‍රහණය කරන්නේ.

විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපි මෛත්‍රී පාලනයක අරුණාලෝකය මේ රටේ දල්වන්නේ යහපාලනය ගෙනැල්ලා, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නැති කරලා, අපි මේ රටේ හොරා කාපු සල්ලි ජනතාවට නැවත ලබා දීලා ඒ තුළින් සහන ලබා දෙමින්. විශේෂයෙන්ම කියනවා. අද නිකන් හරි මහින්ද රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කළා නම්, ඇති වන තත්ත්වය අපට හිතාගන්න පුළුවන්. මට මතක් වෙනවා. මේ යහපාලනය ගැන කථා කරන, පොඩි පොඩි සිදුවීම් ගැන කථා කරන කට්ටිය. අපි අහනවා, කාගේ කාලයේද ලසන්ත වික්‍රමතුංග මැතිතුමා ඝාතනයට ලක් වුණේ. ප්‍රදීප් එක්නැලිගොඩ අතුරුදහන් වුණේ කොයි කාලයේද? මගේ ආදරණීය සහෝදර මාධ්‍යවේදීන් දෙදෙනෙක් වන පෝද්දල ජයන්ත සහ සනත් බාලසූරියට රට අතහැරලා යන්න වුණේ කොයි කාලයේද? ඉතින් ඒ නිසා අපි කියන්න ඕනෑ, මැතිවරණයෙන් පස්සේ මට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිසිපතිවරයෙක් කථා කරලා කියනවා. ආරක්ෂක ලේකම්තුමාට පුදුම උවමනාවක් තිබුණේ, ඔබතුමාගේ ආරක්ෂාව අයින් කරන්න. අන්න ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි මේක කියන්න ඕනෑ. (බාධා කිරීම්) ගරු මහ ඇමැතිතුමාට කියන්න ඕනෑ. අද මේ රටේ රාජපක්ෂලා හොරකම් කරපු තරම හෙළි වෙනවා. (බාධා කිරීම්) මේ රටේ ජනතාව කබලෙන් ලිපට ඇදලා දාලා, අයුක්තිය අසාධාරණය, හොරකම රජ කරන්න ඉඩ දීලා මේ රට හොරුන්ගේ මංකොල්ලකරුවන්ගේ, මිනීමරුවන්ගේ පාරාදීසයක් බවට පත් කරපු එකේ ප්‍රතිඵල අද තේරෙනවා. අද මහින්ද රාජපක්ෂ මහත්මයාට ඡන්දය දීපු අය මේ පවුල හොරකම් කළා කියලා පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා කරුණාකරලා කථාව අවසන් කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඒ නිසා විශේෂයෙන්ම කියන්න ඕනෑ. මේ යහපාලනය ක්‍රියාත්මක කරන්න අපි සම්පූර්ණයෙන් බැඳිලා ඉන්නවා සහ යහපාලනය පොරොන්දු වූ පරිදි ක්‍රියාත්මක කරලා මේ රටේ දින 100 වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් අපි මේ රට දියුණු කරනවා සහ හොරකම් කරන එක නතර කරලා එහි ප්‍රතිලාභ මේ රටේ ජනතාවට ලබා දෙනවා විතරක් නොවෙයි, මාධ්‍යවේදීන්ට නිදහසේ මාධ්‍ය කටයුතු කරගෙන යන්න පුළුවන් හැමෝටම සමාන අවස්ථා ලබා දෙන රටක් නිර්මාණය කරනවා කියලා කියනවා. ඒ සඳහා අපි එක්සත් ජනතා නිදහස් සන්ධානයට එකතු වෙන්නය කියලා ආරාධනා කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් හැටියට, යුතුකමක් වශයෙන් ස්තුති කළ යුතු පාර්ශව තුනක් තිබෙනවා. එකක් තමයි ඒකාධිපති පාලනය පරාජය කිරීමට පසුගිය මැතිවරණයේදී ඡන්දය දුන්නු ජනතාවට. ඒකෙනුත් විශේෂයි පළමුවරට උතුරු - නැගෙනහිර ජනතාව රටේ නායකයා තෝරා ගැනීම සඳහා ඡන්ද පොළට ආවා. ඒ ජනතාවට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම තමයි මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ හරි අඩකට වඩා මම විශ්වාස කරනවා, පසුගිය මැතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරය මඟහැර සිටියා. එතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම තමයි පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධව අපි කනගාටු වෙනවා. අර උදේ කථා කළ අගලවත්ත, බදුරලිය ඇතුළු ඒ ප්‍රදේශවල එම ජනතාව මුහුණ දුන්නු තත්ත්වය. ඒ වාගේම තමයි මැතිවරණ ව්‍යාපාරය ඇතුළත, රත්නපුරේ අර දොලම්ගොඩ මහතා ඇතුළුව කීපදෙනෙක්ම මිය ගියා. ඒ වාගේම කරදරවලට මුහුණ පෑවා. ඒ ජනතාවටත් මේ මොහොතේ කනගාටුව ප්‍රකාශ කරනවා. ඒ වාගේම තමයි හෙළා දැකීමක් කරන්න ඕනෑ. දැන් උදේ කිව්වා, එක මන්ත්‍රීවරයෙකු විසින් දණ ගැස්සුවා කියලා. නව වැනිදා පාන්දර වෙන කොට මුළු රටම දණ ගස්වන්න අරලියගහ මන්දිරයේ කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණා. ඒ කුමන්ත්‍රණයට අගවිනිසුරු ඇතුළු කිහිප දෙනෙක්ම

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

සම්බන්ධ වෙලා සිටියා. ඒ කටයුතු සම්බන්ධව හෙළා දැකීමකුත් කරන්න ඕනෑ. ඒ කරමින් මගේ විශේෂ ප්‍රකාශය ඉදිරිපත් කරනවා.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති මාර්ග ගණනාවක් විධිමත් ලෙස සංවර්ධනය කිරීමට පියවර නොගැනීම නිසා විශාල ජනතාවක් මේ වන විට පීඩාවට පත්ව සිටිනවා. උඩුමුල්ල, හොරණ පාරට සම්බන්ධව තලගල පාර, වග පාදුක්ක පාරෙන් පිංතාලියේ සිට ඉරිදා පොළ දක්වා ඇති මාර්ගය, කොස්ගම - පූගොඩ මාර්ගය, කොස්ගම වැලිකන්න පාර, කහතුඩුව සරණතිස්ස පාර, කහතුඩුව පාසල් මාවත ඇතුළු තවත් මාර්ග ගණනාවක ගමන් ගන්නා මගීන් හා එකී පාරවල්වල අවට ජීවත් වන ජනතාව මේ වන විට පීඩාවට පත්වන අය අතරට සිටිනවා.

ගරු සභාපතිතුමනි, මෙයට හේතු වී ඇත්තේ පසුගිය ජනාධිපතිවරණය ඉලක්ක කර හිටපු මධ්‍යම ආණ්ඩුව විසින් බස්නාහිර පළාත් ආණ්ඩුවද යොදා ගනිමින් සිදු කළ දඩි - බිඩි සංවර්ධන යයි. එම දඩි - බිඩි සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී යොදා ගන්නා නියමිත නීති රීති, ක්‍රමවේද කිසිත් අදාළ වී නැත. මහජන මුදල් සංවර්ධන කාර්යයන් සඳහා යොදා ගන්නා මුදල් රෙගුලාසි ද කිසිත් අදාළ වී නැත. ඡන්දය ඉලක්ක කර ගෙන ගෙනා සාරි කන්ටේනර් පිටින් වරායේ සිර වී ඇතිවා සේම, හිටපු ජනාධිපතිවරයාගේ සහ පුතණුවන්ගේ ඡායාරූප සහිත බිත්ති ඔරලෝසු කන්ටේනර් පිටින් ගොඩ ගැසී ඇතිවා සේම සාටක රූප සහිත පිගන්, කෝප්ප, ජොග්ගු, වැසිකිළි පෝච්චි ගොඩ ගැසී ඇතිවා සේම පළාත් මාර්ගවල ගොඩබාන ලද ABC වර්ගයේ ගල් කුඩු සහිත පාරවල් අතුරන දේවල් ගොඩ ගොඩවල් තැන් තැන්වල දමා ගොස් ඇත. බොහෝ පාරවල්වල ගල් කුඩු පාරට අතුරා ඇත්තේ ඡන්දය දිනට දින දෙක තුනකට ඉහතදීය. මැතිවරණ පරාජයෙන් පසුව සංවර්ධනය නැවතී තිබෙනවා, ගරු සභාපතිතුමනි.

ගරු සභාපතිතුමනි, දැන් එම ප්‍රදේශ දූවිල්ලෙන් වැසී ඇත. වාහන ගමනාගමනයේදී මෙන්ම සුළඟින් ද මහා දූවිලි වළාවක් මඟින් මනුස්ස ජීවිත මහා අපහසුතාවයට පත් කර ඇත. මාර්ග අවට නිවාසවල වර්ණය වෙනස් කොට හැම නිවසක්ම අලුපාටට හැරී ඇත. කොළ පැහැති ගස් කොළන් පෙනෙන්නට නැත. දවල් රෑ වෙනසක් නැතිව නිවාසවල දොර ජනෙල් වසා දමන්නට සිදු වී ඇත. ඡන්දයෙන් පසු දඩිබිඩි සංවර්ධනය පළා ගොස් ඇත. ගරු සභාපතිතුමනි, විෂයය භාර නිලධාරීන්ට දැනුම් දුන්නද කරන්නේ කුමක් දැයි ඔවුන්ට සිතාගත නොහැක. මන්ද ක්‍රමවේද නොසලකා කරන ලද දඩිබිඩි සංවර්ධනය අලුත් දේශපාලන තත්ත්වයක් යටතේ ක්‍රමවේද, නීතිරීති සහිත සංවර්ධන වැඩ බවට පත් කරන්නේ කෙසේද යන්න උගතෝකෝටිය තුළ ඔවුන් සිර වී ඇත. වල් වැදුණු පාලනයක් යටතේ ජනතාවට අත්වන ඉරණම පිළිබඳව මෙයද තවත් එක් උදාහරණයක් පමණි. කෙසේ වෙතත් වර්තමාන පළාත් සභා පාලනයට වහා මැදිහත්වීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනවා. එක. දින කිහිපයක් ඇතුළත දී ජනතාව පත් වී ඇති පීඩාකාරී තත්ත්වයෙන් ගලවා ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වී අදාළ මාර්ග සංවර්ධනය කිරීම. දෙක, පළාත් සභාවේ වගකිව යුතු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

තව දෙකක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාරුයි දෙන්න. තව විනාඩියක් දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

තත්පර දහයක් දෙන්න. එච්චරයි. පළාත් සභාවේ වගකිවයුතු ආයතන මගින් විගණන පරීක්ෂණයක් කොට මේ මාර්ග සංවර්ධන කටයුතු කළ ආකාරය පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කිරීම. තුන, මේවාට වගකිවයුත්තන් වෙනුවෙන් නීති ක්‍රියාමාර්ග ගැනීම. උක්ත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් මෙම විශේෂ ප්‍රකාශය ඉදිරිපත් කරනවා. ඔබතුමාට ස්තුතියි.

**00**81

### ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, මේ ළඟදී දවසක මම විද්‍යුත් මාධ්‍යයෙන් දුටුවා, අපේ පළාත් සභාවට තරග කරපු පළාත් සභා මන්ත්‍රීවරයෙකුට විරුද්ධව මුදල් එකතු කිරීම සම්බන්ධව චෝදනාවක් කරලා, එතුමාගේ ගේ වට කරලා, ගේ ඉදිරිපිට උද්ඝෝෂණය කරනවා. මම දන්න තරමින් ඒ උද්ඝෝෂණය කරපු අදාළ මන්ත්‍රීවරයා මුදල් ගත්තු ඒ මන්ත්‍රීවරයා සමඟ මුළු ඡන්ද ව්‍යාපාරයම එකට ගෙන ගියා. ඒ උද්ඝෝෂණය කරපු මන්ත්‍රීවරයා ඒ කාර්යාලවල ඒ සල්ලිවලින්ම 50% ක් කටවුට්, පෝස්ටර් ගැහුවා. ඒ වේදිකාව භාවිතා කළා. මම දන්න තරමින් ඒ මුදල් එකතු කරපු අදාළ මන්ත්‍රීවරයාට ජනතාව මුදල් දුන්නේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තරග කරපු නිසා. ඒ වෙනුවෙන්. මම හිතන්නේ එතුමා තවම මෙහේ ඉන්නවා. එතකොට 50% ක් මෙය භාවිතා කරපු, භුක්ති විඳපු අදාළ මන්ත්‍රීවරයා පැනලා ගිහිල්ලා. එතකොට මම හිතන්නේ ඒ උද්ඝෝෂණය කරපු මන්ත්‍රීවරයා තමයි 50% ක් ගෙවන්න ඕනෑ. මොකද අර මන්ත්‍රීවරයාට ජනතාව මුදල් දුන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට නේ. එතුමා තවම ඉන්නවා නේ. පැනලා ගිය කෙනා ඉස්සෙල්ලාම මුදල් දීලා අනික් අය සම්බන්ධව කථා කරන්න ඕනෑ.

### ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
Hon. Nishantha Sri Warnasinghe

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම ප්‍රකාශ කරන්න කැමැතියි. පසුගියදා පැවැත්වුණු ජනාධිපතිවරණය කියන්නේ, මේ රටේ ජනාධිපතිවරණ ඉතිහාසයේ ඉතාම තීරණාත්මක ජනාධිපතිවරණයක්. ඇත්ත වශයෙන්ම මේ ජනාධිපතිවරණයේදී එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාර්ශවකරුවෙක් විධියට අපි මුලින්ම ප්‍රකාශ කර සිටියා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලනය යටතේ සිදු වුණු දූෂණ වංචා, අක්‍රමිකතා විතරක් නොවෙයි. ඒ පාලනය යටතේ මේ රට මොනතරම් අගාධයට ගියාද කියන එක පිළිබඳව අපි එතුමාට කරුණු පැහැදිලි කළා. ඒ නිසා අපි කිව්වා, රටට අත්‍යවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන, ප්‍රතිසංස්කරණ සිදු කරන්නය කියලා. නමුත් ඒ කිසිවකට එතුමා ඇහුම්කන් දුන්නේ නැහැ. බලයෙන් උමතු වෙලා සිටියේ. ඒ වාගේම තමයි එතුමා ඉතාම උද්ධච්ච ආකාරයට කටයුතු කළේ. ඒකේ ප්‍රතිඵලයක් විධියට අපට සිදු වුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් එළියට බහින්න. අපි එළියට බැහැලා ඊළඟට අපි කිව්ව දේ තමයි ඒ අත්‍යවශ්‍ය ව්‍යවස්ථා සංශෝධන, දේශපාලන ප්‍රතිසංස්කරණ, ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කිරීම සඳහා මේ රටට අවශ්‍ය ඒ පාලන තන්ත්‍රයේ වෙනසක් නිර්මාණය කිරීම සඳහා පොදු අපේක්ෂකයෙක් ගොඩ නැගීමේ ක්‍රියාදාමයට අපි දායක වුණා.

**00**82

එහිදී අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තම පක්ෂයෙන් එළියට ඇවිල්ලා පොදු අපේක්ෂකයා විධියට මේ රටේ පොදු ජාතික අපේක්ෂාව නියෝජනය කිරීම සඳහා ජනාධිපති අපේක්ෂකයා විධියට ඉදිරිපත් වුණා. ඇත්ත වශයෙන්ම ඒ ස්වර්ණමය අවස්ථාව තුළින් තමයි මේ රට තුළ ජාතික එක්සත් භාවය නිර්මාණය වුණේ. පක්ෂ පාට, ජාති ආගම් භේදයකින් තොරව, ඒ වාගේම සිංහල, දෙමළ මුස්ලිම් බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම්, උගත් නූගත්, ඒ වාගේම උතුර, දකුණ කියන භේදයකින් තොරව, ගම නගරය කියන භේදයකින් තොරව මේ සියලු දෙනා ඒ ජනාධිපතිවරණයේදී ජාතික එක්සත්භාවය ගොඩනගන්න දායක වුණා. කනගාටුවට කාරණය රට තුළ බෙදුම්වාදය නිර්මාණය කරන්න, ජාතිවාදය අවුස්සන්න, ආගම්වාදය අවුස්සන්න, වර්ගවාදය අවුස්සන්න උත්සාහ කරපු ඒ බලවේග අද පරාජයට පත් වෙලා තිබෙනවා. තවමත් උත්සාහ කරනවා, ඒ දුෂ්ට විෂකුරු බලවේග මේ ජයග්‍රහණය නොතකා හැරලා ජාතිවාදය, ආගම්වාදය රට තුළ ඉස්මතු කරන්න. ඒ ගැන මම කනගාටු වෙනවා. මේ සභාව තුළත් ඇතැම් අය තවමත් පෙන්වනවා, ඊළාම් කොඩි එස වෙනවා. ඒ වාගේම තමයි අනිත් පැත්තෙන් අපි කියන්න ඕනෑ.

[සභාවේ ඝෝෂා]

### ගරු ගුණසිරි ජයනාත්
Hon. Gunasiri Jayanath

හලාල් ගෙනැල්ලා ජාතිවාදය, ආගම් වාදය ඇවිස්සුවේ කවුද?

### ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
Hon. Nishantha Sri Warnasinghe

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ජාතිවාදය මොකක්ද? ජාතිකත්වය මොකක්ද? කියන එක ඉතා පැහැදිලිව අපි දන්නවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ජාතික හෙළ උරුමය විධියට -

[සභාවේ ඝෝෂා]

මේ ශීලාචාර රට හදන්න යන්නේ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ කට්ටියත් එක්ක යන්න බැහැ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. NiroshaAthukorala

ජාතිවාදය ඇවිස්සුවේ ගෝඨාභය රාජපක්ෂ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එදා අපි කියපු එක ඕගොල්ලෝ අද කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ ජාතිවාදයේ මුල.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනවරමට ගරු කරලා කරුණාකර කටයුතු කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමා කියන කිසි දෙයක් පැහැදිලිව ඇහෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කරුණාකර මේ බාධා කිරීම් නතර කරන්න. මට වෙලාව ලබා දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට ලියුම් එව්වේ ඔබතුමා නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එදා අපි කියපු ඒවා තමුන්නාන්සේලා අද කියනවා. හරි ෂෝක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

ලියුමකුත් එක්ක CD එකක් එව්වා අපට.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ජාතිකත්වයයි, ජාතිවාදයයි හඳුන්නේ නැති මිනිස්සු කොහොමද දේශපාලනය කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ලැබුණු ජනවරම -

[සභාවේ ඝෝෂා]

ඔයාල ඇයි මේ වෛරයෙන් ක්‍රෝධයෙන් කථා කරන්නේ. මේක මෛත්‍රී පාලනයක්. ඒ මෛත්‍රී පාලනයේ ජාතිවාදය අවුස්සන්න එපා. ජාතික එක්සත්භාවය පවත්වා ගන්න. ජාතික එක්සත්භාවය රකින්න. (බාධා කිරීම්) මේක තමයි මේ විෂිකුරු දුෂ්ට බලවේග.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

කරුණාකර මට වේලාව ලබා දෙන්න. කරුණාකර වාඩි කරවන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මරික්කාර් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා තොප්පිය හැරෙන හැරෙන පැත්තේ. ඔබතුමාට බේරුවල සිද්ධිය මතක ඇති නේ?

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

බේරුවල ජාතිවාදය ඇවිස්සුවේ ඕගොල්ලෝ. ඔබතුමන්ලා එක්ක ඉන්න කොට හොඳයි.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

(බාධා කිරීම්) එක එක්නෙකාගේ කොන්ත්‍රාත් කර ගහන්නේ නැතිව වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, කරුණාකර මේ කට්ටිය වාඩි කරවන්න. ඔබතුමන්ලාගේ පක්ෂයට ජනාධිපති කෙනෙක් හදලා දීලා තිබෙන්නේ අපි. කරුණාකර වාඩි වෙන්න. කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. එතුමාට විනාඩි දෙකයි නේ තිබෙන්නේ. අවස්ථාව දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හැමෝගෙම කිල්ලෝටවල හුණු තියෙනවා. ඕවා පොඩ්ඩක් වහගන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ලංකා දේශපාලන ඉතිහාසයේ ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවක් ගොඩනැඟිලා තිබෙනවා. ඒ ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවට මේ පළාත් සභාවත් මීට අනුරූපී ආකාරයට කටයුතු කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. කරුණාකර මේ ජනවරම ලැබිලා තිබෙන්නේ, මේ රටේ එක්සත් ජාතික පාක්ෂිකයන් හතලිස් අට ලක්ෂයක් ජනතාව ඡන්දය දීලා තිබෙනවා. දෙමළ ජනතාව ඡන්දය දීලා තිබෙනවා. මුස්ලිම් ජනතාව ඡන්දය දීලා තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් ඡන්දය දීලා තිබෙනවා. ඒ සියලු දෙනාගේ ජනාධිපතිවරයෙක් තේරී පත්වෙලා තිබෙන්නේ. ඒ ජනවරමට ගරු කරලා කටයුතු කරන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා කියනතුරු අපි මේ වනතුරු ඕවා දන්නේ නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

මේ පළාත් සභාවත් ඒ ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවට අනුරූපී ආකාරයට, ජාතික සමඟි සන්ධාන පළාත් සභාවක් විධියට කටයුතු කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. ඒ වාගේම මම කියන්න කැමැතියි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. ඔබතුමාට තත්ත්පර දහයක් දෙන්නම්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

පසුගිය පළාත් සභා මැතිවරණයේදී අපේ පක්ෂයේ හිටපු නියෝජ්‍ය ලේකම්වරයෙක්, ඒ වාගේම මන්ත්‍රීවරයෙක් වුණු, එයා දැන් අපේ පක්ෂයෙන් ඉවත් කරලා තිබෙන්නේ. තනතුරුවලින් ඉවත් කරලා තිබෙන්නේ. එයා යහපාලනය සඳහා කියලා, ඒ වාගේම සදාචාරවත් දේශපාලනයක් සඳහා කියලා ජනතාව ඉස්සරහාට ගිහිල්ලා රුපියල් 100/- ක් පූජා කරන්න කියලා කිව්වා. ඒ රුපියල් 100/- එකතු කළා. ඒ රුපියල් 100/- එකතු කරලා -

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ඒ සීයෙන් කොටසක් තමුන්නාන්සේටත් දුන්නා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කරුණාකරලා මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwarnasinghe

කරුණාකර මට විනාඩියක් දෙන්න.

[සභාවේ ඝෝෂා]

එතුමාට රුපියල් 100/-

[සභාවේ ඝෝෂා]

ඒ රුපියල් 100/- පූජා කරපු ජනතාවට අද ඒ මන්ත්‍රීවරයා නින්දා කරනවා, අපහස කරනවා රොඩියෝ කියලා. රොඩියෝ කියලා අද අපහාස කරනවා. අපි කියන්නේ කරුණාකරලා ඒ ලබාගත්ත රුපියල් 100/-

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. කරුණාකර කථා කරන්න ඉඩ දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ජනතාව ලබා දීපු ඒ රුපියල් 100/- ඒ ජනතාවට දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඒ රුපියල් 100/- දුන්නේ, ඒ රුපියල් 100/- පූජා කළේ, ඒ රුපියල් 100/-ලබා දුන්නේ හොරු ආරක්ෂා කරන්න නොවෙයි. වංචනිකයෝ රකින්න නොවෙයි. අපරාධකාරයෝ රකින්න නොවෙයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ඒ ජනතාවට කරපු අපහාසය මේ මොහොතේදී අපි පිළිකුළෙන් යුතුව හෙළා දකිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර කථාව අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර වාඩි වෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon .O. W. Prasanna Sanjeeva

ජාති වාදය ඇවිස්සුවේ කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

නොදන්න දේවල් කථා නොකර ඉන්න. සිංහලකම, බෞද්ධකම ගැන අපට කියලා දෙන්න ඕනෑ නැහැ. රටේ ඒකීයභාවය -

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු සභාපතිතුමා, කථා කරන්න අවස්ථාව දෙන්න. බාධා නොකර ඉන්න කියන්න. - සභාපතිතුමාට බැරි නම් බැහැලා යන්න. ඔබතුමන්ලා වාගේ අයට පාලනය කරන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

කථා කරන කෙනාට කථා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමාට පාලනය කරන්න බැරිද මේ සභාව. එහෙම නම් මේ සභාපතිකමෙන් වැඩක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමිය නිශ්ශබ්ද වන්න. මම ඒක කරගන්නම්. මට කරගන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

රුපියල් 100/- පූජා කරපු -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ රුපියල් 100/- ආපසු දෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri waranasinghe

ඒ මිනිස්සුන්ට රොඩියෝ කියන්න දෙන්න බැහැ. කාටද මේ අපහාස කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා යහපාලනය ගැන කථා කරන්නේ. වෙනසක් කථා කරන්නේ. සභාවේ හැසිරෙන්න ඉගෙන ගන්න. මූලාසනයට ගරු කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri waranasinghe

රුපියල් 100/- පූජා කරපු ඒ ජනතාවට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභාපතිතුමාට ඇඟිල්ල දික් කරන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri waranasinghe

කරුණාකර ඒ ප්‍රකාශය ඉල්ලා අස් කරගන්න කියන්න. ජනතාව අපහාසයට ලක් කරන්න එපා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, දැන් දෙසැම්බර් මාසයේ 01 වැනිදා අයවැය විවාදයේදී මම කියපු එක හැන්සාඩ් වෙලා තිබෙනවා. මම එදා කිව්වා, අට වැනිදායින් පස්සේ හැමෝම මෛත්‍රීපාල සිරිසේනගේ මිනිස්සු වෙනවා කිව්වා. අද ඒක වෙලා තිබෙනවා. මගේ ප්‍රශ්නය මේකයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජයග්‍රහණය කරලා තිබෙන වේලාවේ, දැන් පාර්ලිමේන්තුවේවත් නැති විධියට මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු මෙතැන සභාව ඇතුළට එනකොට ඇඟපත අත ගාලා ගන්නවා, ආරක්ෂාවට කියලා -

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, අපේ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කිව්වා, කෙනෙක් ඇවිල්ලා එතුමාට පල්ලෙහාදී තර්ජනාත්මක විධියට කථා කළා කියලා. දැන් ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යොදවලා තිබෙන්නේ මෙතැන මන්ත්‍රීවරුන්ව ඇඟපත අතගාලා ඇතුළට ගන්න පමණයි. එහෙම ආරක්ෂාවක් දාලා තිබෙනවා නම් එතැන පල්ලෙහාත් ආරක්ෂාවක් දාන්න. එහෙම නැත්නම් මම ඉල්ලා සිටිනවා. මේ මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරු

[ගරු එස්.එම්. මරික්කාර්]

මේ සභාවට ඇතුළට එනකොට ඇඟපත අතගාන එක නවත්වන්න. මෛත්‍රී පාලනයක් දැන් තිබෙන්නේ. ඒක නවත්වන්න ඔබතුමා මැදිහත් වෙන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුන් එකඟ නම් මේ පොලිස් ආරක්ෂාව ඉවත් කරනවාට අපේ විරුද්ධතාවයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව එකඟ නම් මට පුළුවන් පොලිස් ආරක්ෂාව ඉවත් කරන්න කියලා උපදෙස් දෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මහජන ඡන්දයෙන් පත් වුණු මන්ත්‍රීවරු. හරියට නිකන් අපි මේ හොරා කාලා යනවා වාගේ නේ අත ගාන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු මහ ඇමැතිතුමා, එහෙමනම් මහ ඇමැතිතුමාට දීලා තිබෙන පොලිස් ආරක්ෂාවත් අයින් කරන්න ඕනෑ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම නොවෙයි. මෙතුමයි කිව්වේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එහෙමනම් ඔබතුමාට දීපු ආරක්ෂාවත් අයින් කරන්න ඕනෑ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මම කිව්වේ ගරු මන්ත්‍රීවරුන්ගේ ඇඟපත අත ගාන එක නවත්වන්න මිසක පොලිස් ආරක්ෂාව මේ සභාවට එපා කියලා නොවෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෛත්‍රී පාලනයක් යටතේ -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

මෛත්‍රී පාලනයක් තිබෙන නිසා එහෙම ඕනෑ නැහැ. ඇඟපත අතගාන්න ඕනෑ නැහැ නේ. අපි හොරුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීවරුන් කරුණාකර වාඩි වෙන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

අපට හයයි. ආරක්ෂාව ඕනෑ. මේ ගොල්ලෝ මේ කථා කරන විධියට අපට හයයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මට හයයි මේ කොළොන්නාවේ චණ්ඩියා මරික්කාර්. මෙයා හැම වේලේම කිනිස්සක් අරගෙන එනවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ගරු සභාපතිතුමනි, පිස්තෝල අරගෙන ගිහිල්ලා මාට්ටු වුණේ මෙතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හැමදාම ඉනේ තිබෙනවා. අපි විරුද්ධයි.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

පිස්තෝල අරගෙන මාට්ටු වුණේ මෙතුමා. අපි ආයුධ අරන් එන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

[සභාවේ ඝෝෂා]

දැන් අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අපේ සභා ගර්භය තුළ නොයෙක් අදහස් ප්‍රකාශ කර සිටියා.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වන්න. මම සන්තෝෂ වෙනවා. මොකද හේතුව, අලුත් ජනාධිපතිවරයෙක් ඉන්නවා. අපේ ජනාධිපතිවරයෙක් ඉන්නවා. අලුත් රජයේ අගමැතිවරයෙක් ඉන්නවා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලාගේ නොවෙයි. අපේ. ඔබතුමාගේ කොහෙද? ඔබතුමා එතුමාට විරුද්ධව වැඩ කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් කියන්න දෙන්න. අපි ඔක්කෝගේම. අලුත් රජයක්. අලුත් ජනාධිපති කෙනෙක්. අලුත් අගමැති කෙනෙක්. ඔක්කෝමලා ඉන්නවා දැන්. ප්‍රශ්නයක් නැහැ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලාගේ සභාපතිතුමා. අපේ ජනාධිපතිතුමා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔක්කෝමගේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇයි කොටියා කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාට මේ සභා ගර්භය තුළ හැසිරීම - කථා කරන්නේ යහපාලනය. සදාචාරය. සභා ගර්භය තුළ මෛත්‍රී පාලනයක් කථා කරන්නේ. නමුත් එහෙම එකක් නැහැ නේ. මූලාසනයට ගරු කරන්නේ නැහැ. යහපාලනය ඕකද? සදාචාරය ඕකද? පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. එක්කෙනෙක් මට දැන් කිව්වා, මූලාසනය පණ නැහැයිලු. මූලාසනයට හොඳට පණ තියෙනවා. මන්ත්‍රීවරු හොඳට දැන ගන්න.

[සභාවේ ඝෝෂා]

ඒ අය සදාචාරමත් වෙන්න. සභාපතිතුමාට හොඳට පණ තියෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ. කිසිම දෙයක අඩුවක් නැහැ. ඒ නිසා ඒ වාගේ ප්‍රකාශ කරන්න එපා. කරුණාකරලා මේ මෛත්‍රී පාලනයක්. අපි කැමැතියි ඒකට. සදාචාරය තිබෙන්න ඕනෑ. යහපාලනය තිබෙන්න ඕනෑ. අපි කැමැතියි ඒවාට. නමුත් මේ සභාවේ මන්ත්‍රීතුමන්ලා ඒ විධියට ආදර්ශමත් වෙන්න. කථා කරන කොට. ගරු මන්ත්‍රීතුමන්ලා මූලාසනයට ගරු කරන්නේ නැහැ. බාධා කිරීම් කරන්න එපා.

රංජිත් සෝමවංශ ගරු ඇමැතිතුමා, ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ-**අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් අද මැතිවරණ සමයට පෙර හෝ මැතිවරණයෙන් පසුව හිරිහැර දුක් කම්කොටලු සිදු වුණු සියලුම දෙනා වෙනුවෙන් මම මගේ හදවතින්ම දුක් වෙනවා. ඒ වාගේම ඒ සියලු දෙනාටම කනගාටුව පළ කරනවා. අපි සාමය සඳහා, මිත්‍රත්වය සඳහා අත් දෙකම දිගු කරන්න කැමැති අය. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට විනාඩි දෙකයි තිබෙන්නේ. දැන් විනාඩියක් ඉවරයි. තව විනාඩි යයි තිබෙන්නේ. ඉක්මණට කියන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ නිසාවෙන් මේ මැතිවරණයේදී සාමය ආරක්ෂා කරන්න උපරිම විධියට අපි උත්සාහ කළා. සාමය, සහෝදරත්වය මිත්‍රත්තවය යම් යම් එකගතාවය යහපාලනය කොතැනද තිබෙන්නේ, ඒකට අපි එකගයි කියලා පළමුවෙන්ම අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසාවෙන් අද මට විශේෂයෙන් එකම කාරණාවයි කියන්න තිබෙන්නේ. අගලවත්ත ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා. මතුගම ආසනයේ ජගත් පින්නගොඩ මැතිතුමා. අපි සියලු දෙනා මිත්‍රත්වයෙන් දේශපාලනය කළා. කිසිම ගැටලුවක් තිබුණේ නැහැ. හැබැයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[Expunged on the order of the chair]*

මන්ත්‍රීවරයා බදුරලිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ නම කියන්න එපා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. නම සඳහන් කරන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම නම කියන්න ඕනෑ නැහැ. වීඩියෝ පටයේ තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නම ඉල්ලා අස් කරගන්න.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අගලවත්ත ඔරලෝසු කණුව ළග අර අහිංසක මන්ත්‍රීවරයාව දණ ගස්සලා ගැහුවා. එක්සත් ජාතික පක්ෂයේ කොඩි ගැලෙව්වා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නම කියන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මන්ත්‍රීවරයාගේ නම කියන්න එපා.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හරි. හරි. මම ඒක ඉල්ලා අස් කරගන්නම්. නම ඕනෑ නැහැ. මුල් ඇවරියේ ගෙඩියක් ඉදිලා කිව්වාම හරි. නේද? මතක තියා ගන්න. ඒ තරම් කෑත විධියට හැසිරුනේ. එක්සත් ජාතික පක්ෂ කාර්යාලයේ කොඩි කැඩුවේ එතුමා. අපි නොවෙයි. මේ අහන්න. ප්‍රචණ්ඩත්වය මොකක්ද කියන එක. ඒ නිසාවෙන් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දිවුලපිටිය කාර්යාලයේ කොඩි කැඩුවේ තමුන්නාන්සේලාගේ කට්ටිය.

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ කාරණා ඉවසන්නට බැරිව ගම්වල මිනිස්සු බියෙන් තැති අරගෙන විශාල ප්‍රශ්නයක් මතු වුණා. අපි මේක අතිගරු ජනාධිපතිතුමාට මතක් කළා. එතුමා ඒ සම්බන්ධව මැදිහත් වුණා. බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාට. ජගත් පින්නගොඩ ගරු මන්ත්‍රීතුමා, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා මේ ගැන කථා කළා. එතුමාටත්, පොලිස්පතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මතක් කරන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාවේ ගෞරවණීය සභාවක් හැටියට මම හිතනවා, අපි අතර යම් සිදුවීම් මාලාවක් තිබෙනවා නම්, ඒක මෙතැනින් නතර කරලා,තව ඉස්සරහාට නොගිහින් මේ පළාත් සභාවේ යහපාලනයෙන් යුතු පාලනයක් ඇති කළ යුතුයි කියලයි මම තමුන්නාන්සේලාට යෝජනා කරන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, බේරුවල නගර සභාවේ ඉතාමත්ම ශෝචනීය සිද්ධියක් සිද්ධ වුණා. මේ මෛත්‍රී පාලනය පටන් ගත්තාට පස්සේ.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඔබතුමන්ලා පසුගිය කාලයේ කරපුවා මතක නැද්ද?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

බේරුවල නගර සභාව අපේ පාලනය යටතේ තිබෙන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඇයි? අලුත්ගම කඩ ගිනි තිබ්බේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An Hon. Member

බොරු. බොරු.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, මට වේලාව ඕනෑ. මේ ගොල්ලන්ට කථා කරන්න කියලා මට වෙලාව ඕනෑ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

දර්ගා නගරය ගිනි තිබ්බේ ඔබතුමා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බාධා කිරීම් ප්‍රශ්නයක් නැහැ. විනාඩි දෙකයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, විනාඩි දෙක වුණත් අපි ඒ අයට මොනවත් කිව්වේ නැහැ නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කඩ කීයක් ගිනි තිබ්බාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ නිසා මේ අය විශේෂයෙන් මසායිම් මොහොමඩ් කියන විපක්ෂ නායකතුමා බලහත්කාරයෙන් සභාව තමන්ගේ අතට නතු කර ගන්නට ගිය උත්සාහයක්. එහිදී ලේකම්වරියට තර්ජනය කරලා, ඒ වාගේම රාජ්‍ය දේපළ හානි කරලා, ඒවා විනාශ කරලා තමයි මේ අය කටයුතු කළේ. ඒ නිසා ඉතාමත්ම කනගාටුදායක සිද්ධියක් බේරුවල නගර සභාව තුළ සිදු වුණා.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

ඇයි ඉෆ්තිකාර් මන්ත්‍රීතුමාට ගහපුවා.

[සභාවේ ඝෝෂා]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මෛත්‍රී පාලනය මොකක්ද කියලා අපි දන්නවා. ඒ වාගේම බේරුවල ආසනයේ නව වැනිදා සිට තත්ත්වය ඒ තරම් හොඳ නැහැ. ඒකට හේතුව තමයි අපේ සංවර්ධන කටයුතු සඳහා සකස් කරලා තිබුණු නාම පුවරු පවා විනාශ කළා. ඊළඟට මහජන එක්සත් පෙරමුණේ කළුතර දිස්ත්‍රික් සංවිධායක සමිත කවිරත්න කියන අපේ සංවිධායකතුමාගේ ගෙට ගල් ගහලා, මරණීය තර්ජන කරලා මේ විදියට තමයි මේ මෛත්‍රී පාලනය බේරුවලින් පටන් ගත්තේ. ඒ නිසා අපි විශේෂයෙන්ම බේරුවල ආසනයේ අන්තවාදී ලෙස කටයුතු නොකරපු අපේ ආදරණීය මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජයග්‍රහණය කරන්න -

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අම්මේ! එයා තමයි ජාතිවාදය හොඳටම වැපිරෙව්වේ. එයා ඒකයි ගෙදර ගියේ.

[සභාවේ ඝෝෂා]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ස්තුතිය පුද කරනවා. වෙන අය වාගේ නොවෙයි. පාව දෙන්න ලැහැස්ති නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඕවා බොරු, පච.

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

කවුද ජාතිවාදය වැපිරෙව්වේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

විශේෂයෙන්ම ජාතිවාදය කථා කරපු අය තමයි බේරුවල ජාතිවාදය ඇති කළේ. ඒ නිසා අපි විශේෂයෙන්ම කියනවා, මෙවැනි අසික්කිත මට්ටමින් පාලනයක් -

[සභාවේ ඝෝෂා]

**ගරු එස්.එම්. මරික්කාර්**
Hon. S. M. Marikkar

අසික්කිත විධියට ජාතිවාදය වැපිරෙව්වේ ඔබතුමන්ලා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මෛත්‍රී පාලනය, යහපාලනය නැහැ ගරු සභාපතිතුමනි,විශේෂයෙන්ම ඉෆ්තිකාර් සහෝදරයා කිව්වා, එතුමාට වුණු සිද්ධිය පිළිබඳව. අපි පැහැදිලිව දන්නවා මොනවද සිදු වුණේ කියලා. දෙපැත්තේම වැරැදි තිබෙනවා. මේවා එකින් එක මතු කරන්න, -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කථා කරන්න දෙයක් නැහැ. කරුණාකර වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

අපි දන්නවා, මල්වත්තේ සර්පයා පිළිබඳව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජාතිවාදය ප්‍රතික්ෂේප කරලා ඉවරයි. දැන් ඒවා ගැන කථා කරන්න එපා. ජනතාව ප්‍රතික්ෂේප කරලා ඉවරයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, එම නිසා අපි අහන්නේ මේ යන්නේ කුමන පාලනයකටද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

මේ යන්නේ යහපාලනයකට නොවෙයි. ඒ නිසා අපි හෙටත් මේකට විරුද්ධයි. ඒ පිළිබඳව මතක් කරමින් විශේෂයෙන් අපේ බේරුවල ආසනයේ ජනතාවට අපේ ප්‍රණාමය පුද කරනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, මෙතුමා කළ ප්‍රකාශයේ මගේ නම සඳහන් වීම පිළිබඳව 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. බේරුවල නගර සභාවේ උප සභාපති සජිත් දේවප්‍රියගේ තාත්තා බලෙන් ගිහිල්ලා නගර සභාවේ ජනේලවල වීදුරු කැඩුවාට එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායකවත්, මසාහිම් මොහොමඩ්වත් පළි නැහැ. ඒ පිළිබඳව -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මොනවද මේ වරප්‍රසාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් කිව්වාම මම දන්වාද මොනවද කියන්නේ කියලා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු සභාපතිතුමනි, සභාව නොමඟ යවන්න හදන්නේ. පැහැදිලිව ලේකම්වරිය සහ සියලු දෙනාම මේ පිළිබඳව කට උත්තර දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

දැන් මසාහිම් මොහොමඩ්ව අත්අඩංගුවට ගන්න ඉන්නේ. බොරු ප්‍රකාශ කරන්න එපා. මම ඒකයි කිව්වේ.

[සභාවේ ඝෝෂා]

මල්වත්තේ සර්පයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, දැන් පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒකෙන් නම ඉවත් කරන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා මගේ නම කිව්වා නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මම ඔබතුමාගේ නම ඉවත් කරන්නම්. වාඩි වෙන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මම ඇහුවේ නැහැ නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙන ඒවා නේ කියන්නේ. ඔබතුමාට ප්‍රකාශයක් කරන්න දෙන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මෙතුමා කියන්නේ දෙපැත්තේම වැරැද්දක් තිබෙනවා කියලා. මොකක්ද අපි කරපු වැරැද්ද කියලා කියන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් නම්, මම ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මෙහෙම බොරු කියලා සභාව නොමග අරිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා දෙන්නාම කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

## පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු රංජිත් සෝමවංශ**-අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*අද දින 2015.01.20 වැනි දින විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2015 පෙබරවාරි මස 02 වන දින එනම් සඳුදා දින පෙ.ව. 09.30ට රැස් විය යුතු අතර, 2015.02.03 වන දින එනම් අඟහරුවාදා දින සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියා කළ යුතු යැයි*" මම යෝජනා කර සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

*ගරු සභාපතිතුමනි,"පොදු වැදගත්කමින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්යපටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටු විය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS' MOTION:

## 6 වන විධායක ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ප්‍රණාමය පුදකිරීම
SALUTATION TO THE SIXTH EXECUTIVE PRESIDENT MAITHRIPALA SIRISENA

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. IsuraDevapriya

*ගරු සභාපතිතුමනි,"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති තෝරා පත් කර ගැනීම සඳහා පැවති 7 වන ජනාධිපතිවරණයෙන් ශ්‍රී ලංකාවේ 6 වන විධායක ජනාධිපති වශයෙන් තේරී පත් වූ අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් හට මෙම ගරු සභාවේ ප්‍රණාමය පුද කරන අතර, දින සියයේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා අප සැමගේ උපරිම දායකත්වය ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටින්නීය."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට කාලය සීමා කරන්න බැහැ. නමුත්, මම හිතන්නේ අපි උපරිම උත්සාහ කරමු වෙලාව බෙදාගෙන ඉක්මනට ඉවර කරන්න. නේද? ගොඩක් වෙලා යනවා නේ? දිවා භෝජනයත් නැති නිසා. එහෙම නම් ඔබතුමා විනාඩි 08 ක් කථා කරන්න.

[අ.භා. 12.26]

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, ලංකා දේශපාලන ඉතිහාසයේ වැදගත් වූ ක්‍රියාදාමයක් පසුගිය අට වැනිදා පැවැත්වූ මැතිවරණයේදී සිද්ධ වුණා. විශේෂයෙන්ම මේ රටේ දේශපාලන ඉතිහාසය දිහා බලන කොට මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් වරින් වර මේ රට පාලනය කළා. නමුත් ඒ පක්ෂ දෙක පාලනය කිරීමේදී සමහර දේවල් මේ රටේ යථාර්ථයක් වූ අතර, සමහර දේවල් අසාර්ථක වුණා. කොහොම නමුත් එවැනි අවස්ථාවලදී සමහර වෙලාවට රට ස්ථාවර වුණු අවස්ථා තිබුණා. අස්ථාවර වුණු අවස්ථා තිබුණා. අපට මතකයි. මේ රට මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වය. අද මේ රට ඒ තත්ත්වයෙන් සෑහෙන දුරට මුදවාගෙන, අද මේ රට ආර්ථික අතින් දියුණු මට්ටමකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා පසුගිය ජනාධිපතිවරණයේදී අපි කවුරුත් බලාපොරොත්තු නොවුණු වෙලාවකදී විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ එකතු වෙලා විපක්ෂයේ පොදු අපේක්ෂකයෙක් හැටියට අපගේ පක්ෂයේ ප්‍රධාන ලේකම් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විපක්ෂයේ පොදු අපේක්ෂකයා හැටියට තරගයට ආවා. ඒ මැතිවරණයේදී අපගේ පක්ෂය නියෝජනය කරමින්, අපේ පක්ෂයේ ගරු සභාපති, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තරග කළා. ඒ මැතිවරණය කරට කර මැතිවරණයක්. ඒ මැතිවරණයෙන් ඉතා පැහැදිලි ලෙස මේ රටේ සමස්ත බහුතර ජනතාවගේ ඡන්දයෙන් යහපාලනයක් උදෙසා, මේ රටේ වෙනසක් කිරීම උදෙසා වූ පාලනයක් සඳහා යමින් VI වන විධායක ජනාධිපතිවරයා හැටියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව පත් කර ගත්තා. ඒ මැතිවරණයේදී විපක්ෂයේ පොදු අපේක්ෂකයා හැටියට එතුමා ඉදිරිපත් කරපු දින 100 වැඩ සටහන පිළිබඳව රටේ ජනතාව තුළ ඇති වී තිබෙන්නේ විශාල වූ බලාපොරොත්තුවක්. ඒ සඳහා මේ වන කොට පාලක

පක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ අයගේ ද සහයෝගය ඒ වෙනුවෙන් පළ වෙලා තිබෙනවා. ඒක ජාතික දේශපාලනයේ අපි දකින විශාල ප්‍රවණතාවයක්. මේ එකමුතුකම, මේ සදාචාරය, මේ ජාතික ආණ්ඩුව ශ්‍රී ලංකාවට විතරක් නොවෙයි, අනෙකුත් රටවල්වලටත් ආදර්ශයක්. මම හිතනවා, මේ වෙලාවේදී අපට, විශේෂයෙන්ම මේ මහ පොළොවේ එදා අපි දැකපු සිහිනය මේ රටේ රජයේ සේවකයාගේ ඉඳන්, කම්කරු පන්තිය දක්වා බලාපොරොත්තු වුණේ රජයක් තුළින් විශාල සහන ලබා ගන්න. ඒ නිසා ඒ සහනවල අපේක්ෂාව මල් එල දරන තුරු මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙමින් සිටිනවා. අනික මේ දින 100 වැඩ සටහනට සහ මේ රජය ගෙනියන වැඩ සටහනට විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂත්, ආණ්ඩු පක්ෂයේ සියලු දේශපාලන පක්ෂත්, ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණත් වක්‍ර ආකාරයෙන් මේ දින 100 වැඩ පිළිවෙළ සහ මේ ආණ්ඩුව, මේ යහපාලනය මේ මහ පොළොවේ යථාර්ථයක් කරන්නට අද සහයෝගය පළ කරලා තිබෙනවා.

ඒ නිසා සමස්ත රටේ ජනතාවගේ අවධානය අද මේ දින 100 වැඩ සටහනට යොමු වෙලා තිබෙනවා. ඒ නිසා ලංකාවේ වගකිවයුතු පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන අපි සියලු දෙනාම පක්ෂ භේදයෙන් තොරව එකමුතුව, එක්සිත්ව මේ දින 100 වැඩ සටහන සාර්ථක කරලා, මේ රටේ අනාගතය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එක්ක එක්ව ඉෂ්ට කරන්නට මේ පළාත් සභාවත් එක් විය යුතු යැයි කියන අදහස මම මේ අවස්ථාවේදී මතක් කරමින්, කාලය කෙටි කර ගන්න ඕනෑ නිසා මගේ කථාව කෙටි කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා මේ සභාවට රීති අත්හිටුවමින් ගෙනාපු යෝජනවා. මම හිතන්නේ, අපි සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත විවාදයකින් තොරව සම්මත කර ගන්නය කියන අදහස මම ඔබතුමා මාර්ගයෙන් ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

*[නැගී සිටියේය.]*
*[Stood]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අදහස් ප්‍රකාශ කරන්න අවශ්‍යද? අවශ්‍ය නැහැ නේ? මම හිතන්නේ එතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ඔක්කොම එකඟයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොම එකඟයි නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඉතින් ඕනෑ නැහැ. එතුමා යෝජනාව ස්ථිර කළා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, දැන් මේ යහපාලනය යටතේත් ප්‍රජාතන්ත්‍රවාදයට ඉඩ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. සියලු දෙනාම එකඟයි කියලා යෝජනාවක් ගෙනාවා නේ දැන්. එකඟයි කිව්වා නේ?

[අ.භා. 12.30]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

කථා කරන්න බැරිද? (බාධා කිරීම්) හරි. අපි විනාඩියෙන් - අපි ස්තුතියක් කරන්නේ. ගරු සභාපතිතුමනි, දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ රටේ අතිගරු ජනාධිපතිතුමා ලෙස අභිනවයෙන් පත් වූ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත අපි සියලු දෙනාගේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ, යහපත් මිනිසුන් නිර්මාණය කරන්නේ පරිසරය විසින්ය කියලයි මගේ විශ්වාසය. ඒ නිසාවෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කවරෙක්ද යන්න මූලාසනයේ සිටින ගරු සභාපතිතුමාත්, මහ ඇමතිතුමාත්, අපිත් මේ අද විපක්ෂය හැටියට සඳහන් වන ඔබ සියලු දෙනාට වඩා හොඳින් ඇසුරු කළ, හොඳින් දන්නා කෙනෙක් බව ප්‍රකාශ කරන්න කැමැතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුනට, හතරට කැඩිලා තිබුණු කාලයේ පුලතිසි පුරවරයෙන් ආපු මේ ජව සම්පන්න තරුණයා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ජවය ඇතුළු කළේ කියන එක බොහොම ආඩම්බරයෙන් මතක් කරන්නට ඕනෑ. එතුමා ඒ කාලේ බස් එකෙන් ආවා. කෝච්චියෙන් ආවා. එතුමා ඒ කාලේ පරණ කාර් එකෙන් ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය ගන්න, ආණ්ඩුව හදන්න, මේ රටේ තැළුණු, පොඩි වුණු මිනිස්සුන්ගේ දුක හඳුනන (බාධා කිරීම්) ඈත දුෂ්කර ගම්බද ප්‍රදේශවලට අනනන්ත අප්‍රමාණ සේවයක් කළා. මම මතක් කරන්න ඕනෑ. ඉතිහාසයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැටිලා තිබෙද්දී (බාධා කිරීම්)

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ඡන්ද කාලයේ මතක් වුණේ නැද්ද ඉතිහාසය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ පක්ෂයේ අභිවෘද්ධිය සඳහා කටයුතු කරපු මහ ලේකම්තුමා තමයි අද මේ රටේ අලුත් ජනාධිපතිතුමා. අපි එතුමාත් එක්ක යහපාලනය සඳහා එකට බැඳී ඉන්නවාය කියන එක බොහොම ආඩම්බරයෙන් මතක් කරමින්, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.33]

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, මට විනාඩි 03 ක කාලයක් ලබා දෙන්න. අදහස් ප්‍රකාශ කිරීමක්. කැමැත්තෙන්. ගරු සභාපතිතුමනි, මම 1970 සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන ජ්‍යෙෂ්ටම මන්ත්‍රීවරයෙක්. 1970 සෝමවීර චන්ද්‍රසිරි මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. අද මේ දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. කිසිම බලපෑමකට, හිතවත්කමකට, මිත්‍රකමකට, යාළුකමකට, අල්ලසකට, පගාවකට කිසිම අවස්ථාවක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අත්හැරලා ගියේ නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මගේ සංවිධායකම නැති වුණා. මගේ ඇමතිකම් නැති වුණා. සභාපතිකම් නැති වුණා. ඒ මොන දේ වුණත් පක්ෂයත් එක්ක මම හිටියා. පසුගිය මැතිවරණය වෙලාවේ විශාල කැපවීමක් කළා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජයග්‍රහණය කරවන්න. බොරු නොවෙයි මේ. මම සත්‍ය කථා කරන්නේ. විශාල කැප වීමක් කළා.

හැබැයි, සමහර දේශපාලඥයෝ පත්තරවලට දැන්වීම් දානවා, අපි ජයග්‍රහණය කළාය කියලා. එක පුද්ගලයකුගේ ජයග්‍රහණය නොවෙයි. පළාත් සභා මන්ත්‍රීවරු, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, ශාඛා සමිතිවල නියෝජිතයෝ, දූප්පත් අහිංසක ජනතාව, සියලු දෙනා එකතු වෙලා තමයි හෝමාගම ආසනයේ 77,000 ක් ඡන්ද ලබා දුන්නේ. එක පුද්ගලයෙක් ලබා ගත්ත ඡන්ද නොවෙයි. අපි එදා දිවි හිමියෙන් කටයුතු කරලා, මොන ප්‍රශ්න, බාධක තිබුණත් - ප්‍රධාන අමාත්‍යතුමා ඒ පිළිබඳව දන්නවා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කටයුතු කළා. අපි ඒක හංගන්නේ නැහැ. බොරු කියන්නේ නැහැ. එතුමා පරාජයට පත් වුණා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, මේක ඉතාමත් වැදගත් යෝජනාවක්. දෙපැත්තෙන්ම සම්මත වුණා දැන්. යෝජනාව සම්මත කළා නේ දැන් ඉතින්.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒක කියන්නේ නැතිව කථා කරන්න බැහැ ගරු සභාපතිතුමා. ඉතිහාසය කියන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, ඉතා වැදගත් යෝජනාවක් ගෙනාවේ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

යෝජනාවක් ගෙනාවාම, ඒ යෝජනාවට කථා කරන්න ගරු මන්ත්‍රීවරුන් බලා ගෙන ඉන්න මොහොතක විපක්ෂයෙන් කථා කළාය කියලා සියලු දෙනාගේම කථා කිරීමේ අයිතිය නැති කරන්න එපා ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැති කරන්නේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

යෝජනාව ඉදිරිපත් කරන වෙලාවේ අපි බලාගෙන හිටියා වචනයක් කථා කරන්න. මම කථා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, එහෙම නැති කරන්නේ නැහැ. නමුත් ඒ යෝජනාව සම්මත කළා. දෙපැත්තේම එකඟතාවයෙන්. ආපහු කථා කරනවා කියන්නේ ප්‍රශ්නයක් වෙනවා. ඒකයි.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

මේවා හොරෙන් කරන වැඩ නොවෙයි. තමන්ගේ හදවතේ තිබෙන දේවල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට යෝජනාව හැල්ලු වෙනවා.



**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු සභාපතිතුමනි, මට අවසන් කරන්න දෙන්න. පළමුවෙන් මම කිව්වේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මම කටයුතු කළා. අද වර්තමානයේ ගරු මෛත්‍රීපාල සිරිසේන අපේ හිටපු ලේකම්තුමා. ඒ කාලේ මට මතකයි. අපට කරදරයක්, දුකක් වෙන කොට - කවුරුත් දන්නවා. අවංකව හිතට තට්ටු කරලා කථා කළොත් පක්ෂයේ මොනවා හරි වුණාම අපි දුවගෙන ගියේ අපේ ලේකම්තුමා ළඟට. සර්, අපට මෙහෙම දෙයක් වෙලා තිබෙනවා. පොඩ්ඩක් බලන්න කියලා. එතුමාට උදව් නොකළාට අපේ යම්කිසි හිතවත්කමක් එතුමා කෙරෙහි තිබුණා. නමුත්, ඡන්දය දුන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මුළු සමස්ත රටේ ජනතාවම මොන පක්ෂයකින් ඉදිරිපත් වුණත්, විපක්ෂයේ පොදු අපේක්ෂකයා හැටියට එතුමා අද ජයග්‍රහණය කරලා තිබෙනවා. (බාධා කිරීම්) මම අවසාන වශයෙන් කියන්නේ මේකයි. අපි සියලු දෙනාගේම හැල හැප්පීම් තිබෙනවා. උදේ පාන්දර මෙතැනට ආපු වෙලාවේ ඉඳලා කිසිම මන්ත්‍රීවරයෙකුට කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. යම්කිසි පුද්ගලයෙක් හැටියට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියක් තිබෙනවා. ඒක හරි වෙන්න පුළුවන්. තව කෙනෙකුට වැරදි වෙන්න පුළුවන්. නමුත් මින් පසුව හරි මේ සභාවේ මම විපක්ෂ කණ්ඩායමට අපේ ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා මගින් මම ඉල්ලා සිටිනවා. අපි සියලු දෙනා එකතු වෙලා මෛත්‍රී පාලන යුගයේ බලාපොරොත්තුව, මේ රට ස්වයංපෝෂිත කිරීමයි. මේ රටේ සියලු දෙනාටම සම අයිතිය ඇති වන ආකාරයෙන් මේ වැඩ කටයුතු ඉදිරියට ගෙන යෑමයි.

ඒ නිසා අපි සියලු දෙනා එකතු වෙලා, ඉදිරියේදී මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමාට සහයෝගය ලබා දීලා, අපේ රට තවත් සංවර්ධනය කරලා, මේ රටේ තිබෙන වංචාව, දූෂණය සියලු දේවල් නැති කරලා, මින් ඉදිරියට සියලු දෙනාටම ජීවත් වෙන්න හොඳ පරිසරයක් ඇති කරලා කටයුතු කරන්නට මෛත්‍රීපාල සිරිසේන අපේ විධායක ජනාධිපතිතුමාට ශක්තිය, ධෛර්යය වාසනාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපි මේ රටේ යහපාලනයක් ඇති කරන්න, සියලුම විපක්ෂයේ අය එකතු වෙලා කටයුතු කරන කොට ඊට එරෙහිව ඡන්දය පාවිච්චි කරපු, ඡන්දය සංවිධානය කරපු පිරිස අද පත් වුණු ජනාධිපතිතුමා ගැන ගුණ ගායනා කරනවා. ඒ නිසා අපි අවබෝධයෙන් ජීවත් වන පිරිසක්. අනවබෝධයෙන් ජීවත් වුණු පිරිසට ගුණ ගායනා කරන්න අවස්ථාව දීලා අපි නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
## ADJOURNMENT

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 12.39 ට, 2015 පෙබරවාරි මස 02 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 12.39 p.m till 09.30 a.m, on 02.02.2015.*